


# මාධ්‍ය සඳහා මාර්ගෝපදේශය

මෙය සමරිසි ගැහැණු, සමරිසි පිරිමි, ද්වීරිසි, සංක්‍රාන්ති සමාජභාවී පුද්ගලයන් සහ කුවියර් (LGBTQ) පුද්ගලයින් විවිධ මාධ්‍යයන් හරහා නිවැරදිව සහ සචේතනිකව නියෝජනය කිරීමට දායක වන, BRIDGE TO EQUALITY ව්‍යාපෘතිය මඟින් සකස් කරන ලද මාධ්‍ය යොමු මාර්ගෝපදේශයකි. මෙහි අරමුණ වනුයේ, මාධ්‍ය ආයතන, මාධ්‍යවේදීන් සහ මාධ්‍යකරුවන් සඳහා නිර්දේශ ඇතුළත් මාර්ගෝපදේශයක් සැපයීමයි.

# පටුන

**හැඳින්වීම**.......... 2

BRIDGE to Equality ව්‍යාපෘතිය (BRIDGE) ජාත්‍යන්තර මානව හිමිකම් නීතිය භාවිතයෙන් යුක්තිය පසිඳලීමේ ක්‍රියාකාරීන් (විනිසුරුවරුන්, නීතිඥයින් සහ අනෙකුත් නීති වෘත්තිකයන්), ක්‍රියාකාරීන් සහ මානව හිමිකම් ආරක්ෂකයින් ගේ සහයෝගයෙන් ශ්‍රී ලංකාවේ LGBTQ ප්‍රජාවගේ මානව හිමිකම් ආරක්ෂා කිරීම වැඩිදියුණු කිරීම අරමුණු කරයි. මෙමගින්, වත්මන් නීතිමය රාමුව විසින් පනවන ලද අභියෝග ජය ගැනීම සහ LGBTQ ප්‍රජාවගේ සමස්ත ප්‍රවර්ධනය සහ මානව හිමිකම් ආරක්ෂා කිරීම කෙරෙහි අවධානය යොමු කරයි. 2021 සිට DAST, National Transgender Network, Young Out Here යන සංවිධාන ඒකාබද්ධව, International Commission of Jurists සහයෝගීත්වයෙන්, BRIDGE ක්‍රියාත්මක වේ.

**පාරිභාෂික ශබ්ද මාලාව** .......... 3

LGBTQ වචන සඳහා යාවත්කාලීන කරන ලද දේශීය භාෂාව .......... 3
මාධ්‍ය වචන සඳහා යාවත්කාලීන කරන ලද දේශීය භාෂාව .......... 7

**ප්‍රේක්ෂකයන්** .......... 9

**මාධ්‍ය ආචාර ධර්ම පිළිබඳ දළ විශ්ලේෂණයක්**.......... 11

සාමාන්‍ය මාධ්‍ය ආචාර ධර්ම .......... 11

1. මාධ්‍යවේදීන් සඳහා වන ආචාර ධර්ම සංග්‍රහය .......... 11
2. ශ්‍රී ලංකා පුවත්පත් පැමිණිලි කොමිසම විසින් අනුවර්තනය කරන ලද ශ්‍රී ලංකා කතෘ සංසදයේ වෘත්තීය පුහුණු සංග්‍රහය (ආචාර ධර්ම සංග්‍රහය).......... 12
3. සමාජ මාධ්‍ය ප්‍රකාශය .......... 12

ශ්‍රී ලංකාවේ මාධ්‍ය විසින් කරනු ලබන වෙනස් කොට සැලකීමේ සහ අවමන් සහගත වාර්තාකරණය සහ වඩා හොඳ භාවිතයක් සඳහා වන යෝජනා.. .......... 19

වළක්වා ගත යුතු වචන සහ වාක්‍ය ඛණ්ඩ. .......... 28

නිතර මතුවන ප්‍රශ්න සඳහා පිළිතුරු. .......... 30

**LGBTQ ප්‍රජාව වැනි ආන්තීකරණයට ලක් වූ ප්‍රජාවන්ට එරෙහිව සිදු වන වෙනස්කොට සැලකීමේ පදනමේ වගකීම.** .......... 31

# හැඳින්වීම

මෙය සමරිසි ගැහැණු, සමරිසි පිරිමි, ද්වීරිසි, සංක්‍රාන්ති සමාජභාවී පුද්ගලයන් සහ කුවියර් පුද්ගලයින් (LGBTQ) විවිධ මාධ්‍යයන් හරහා නිවැරදිව සහ සචේතනිකව නියෝජනය කිරීමට දායක වන, BRIDGE TO EQUALITY ව්‍යාපෘතිය මඟින් සකස් කරන ලද මාධ්‍ය යොමු මාර්ගෝපදේශයකි. මෙහි අරමුණ වනුයේ, මාධ්‍ය ආයතන, මාධ්‍යවේදීන් සහ මාධ්‍ය කරුවන් සඳහා නිර්දේශ ඇතුළත් මාර්ගෝපදේශයක් සැපයීමයි.

LGBTQ ප්‍රජාව සමන්විත වන්නේ සමාජය විසින් "සාමාන්‍ය" හෝ "පිළිගත හැකි" යැයි සලකනු ලබන කරුණු සමග සමපාත නොවන විවිධ ලිංගික දිශානතීන්, සමාජභාවයන් සහ සමාජභාවී ප්‍රකාශනයන් සහිත පුද්ගලයන්ගෙනි. මෙනිසා, LGBTQ ලෙස හඳුනා ගන්නා පුද්ගලයන් බොහෝ විට සමාජය විසින් අපහාසයට, වෙනස් කොට සැලකීමට, නඩු පැවරීමට සහ හිංසාවට ලක් වේ.

තවද, 1833 ශ්‍රී ලංකාවේ දණ්ඩ නීති සංග්‍රහයේ 365 වගන්තිය සහ 365අ වගන්තිය යටතේ, ලෞකික සංසර්ගය සහ 'සමරිසි පුද්ගලයින් අතර දරුණු අශෝභන ක්‍රියා (නීතියේ " ස්වභාවධර්මයේ පිළිවෙළට එරෙහිව සිදුකරන ක්‍රියා" ලෙස විස්තර කෙරේ) ශ්‍රී ලංකා නීතිය මගින් අපරාධයක් ලෙස සැලකේ. මේ අනුව, අදාල පුද්ගලයන්ගේ සමාජභාවය නොසලකා වැඩිහිටියන් අතර කැමැත්ත මත පවතින සමරිසි ලිංගික ක්‍රියා සාපරාධී කෙරේ. මෙම දණ්ඩ නීති විවිධ සමාජ අපකීර්තියන් සමඟ එක්ව, LGBTQ පුද්ගලයන් දශක ගණනාවක් තිස්සේ අගතීන්, අසාධාරණයන් සහ ප්‍රචණ්ඩත්වයට ගොදුරු කර ඇත. 1990 දශකයේ අගභාගයේ දී මතු වූ සමරිසි සබඳතා නිර්සාපරාධීකරණය කිරීමේ ව්‍යාපාරය ශක්තිමත්ව වර්ධනය වී ඇතත්, මෙම නෛතික, දේශපාලනික සහ සමාජීයීය බාධක තවමත් පවතී. කෙසේ වෙතත්, අපගේ අදහස වනුයේ, විවිධ මාධ්‍ය මගින් LGBTQ ප්‍රජාවගේ යහපැවැත්ම සඳහා සැලකිය යුතු දායකත්වයක් ලබා දිය හැකි බවයි. එනම්,

- එමගින් ලිංගික දිශානතිය, සමාජභාවී අනන්‍යතාවය සහ ප්‍රකාශනය SOGIE සහ LGBTQ පුද්ගලයන් සහ ඔවුන් මුහුණ දෙන ගැටළු/අභියෝග පිළිබඳව දැනුවත් කිරීමක් කළ හැකිය.
- නිවැරදි වාර්තාකරණය, සංවේදී වාර්තාකරණය සහ සදාචාරාත්මක වාර්තාකරණය සහතික කිරීම මගින් එම පුද්ගලයන්ගේ ආරක්ෂාව, අභිමානය සහ මානව හිමිකම් ආරක්ෂා වන ආකාරයෙන් පුද්ගලයකුගේ සත්‍ය හෝ අවබෝධ කරගත් SOGIE සම්බන්ධ සිද්ධීන් වාර්තා කළ හැකිය.
- එමගින් LGBTQ ප්‍රජාව කෙරෙහි පාඨකයන් සහ නරඹන්නන් තුළ සංවේදනය ඇති කළ හැකිය.
- එමගින් වෙනස් කොට සැලකීමකින් තොර, මානව හිමිකම්වලට ගරු කරන, රටේ සියලුම පුරවැසියන්ට සමාන පරිසරයක් නිර්මාණය කිරීමට දායක විය හැකිය.

## BRIDGE to Equality

BRIDGE to Equality ව්‍යාපෘතිය (BRIDGE) ජාත්‍යන්තර මානව හිමිකම් නීතිය භාවිතයෙන් යුක්තිය පසිඳලීමේ ක්‍රියාකාරීන් (විනිසුරුවරුන්, නීතිඥයින් සහ අනෙකුත් නීති වෘත්තිකයන්), ක්‍රියාකාරීන් සහ මානව හිමිකම් ආරක්ෂකයින් ගේ සහයෝගයෙන් ශ්‍රී ලංකාවේ LGBTQ ප්‍රජාවගේ මානව හිමිකම් ආරක්ෂා කිරීම වැඩිදියුණු කිරීම අරමුණු කරයි. මෙමගින්, වත්මන් නීතිමය රාමුව විසින් පනවන ලද අභියෝග ජය ගැනීම සහ LGBTQ ප්‍රජාවගේ සමස්ත ප්‍රවර්ධනය සහ මානව හිමිකම් ආරක්ෂා කිරීම කෙරෙහි අවධානය යොමු කරයි. 2021 සිට DAST, National Transgender Network, Young Out Here යන සංවිධාන ඒකාබද්ධව, International Commission of Jurists සහයෝගීත්වයෙන්, BRIDGE ක්‍රියාත්මක වේ.

# පාරිභාෂික ශබ්ද මාලාව

## LGBTQ වචන සඳහා යාවත්කාලීන කරන ලද දේශීය භාෂාව

මෙය GLAAD Media සහ යොමු මාර්ගෝපදේශය හි අනුවර්තනයක් සහ, 2018 දී Equal Grounds විසින් සංවර්ධනය කරන ලද මාධ්‍ය යොමු මාර්ගෝපදේශවල යාවත්කාලීන කරන ලද දේශීය ව්‍යවහාරය කි.

**ලිංගික දිශානතිය:** ලිංගික දිශානතිය පුද්ගලයෙක්ට වෙනත් අයෙකු කෙරෙහි පවතින ශාරීරික, රෝමාන්තික හෝ චිත්තවේගීය ආකර්ශනය පිළිබඳ හැගීම් විස්තර කරයි. ලිංගික දිශානතිය සඳහා උදාහරණ ලෙස, විෂමරිසි (straight), සමරිසි පුරුෂ, සමරිසි ස්ත්‍රී, ද්වීරිසි, කුවියර්, ආලිංගික සහ වෙනත් දිශානති ඇතුළත් වේ.

**සමාජභාවී අනන්‍යතාවය :** සමාජභාවී අනන්‍යතාවය යනු තමාගේ සමාජභාවය පිළිබඳව තමන් තුළ පවතින අභ්‍යන්තර සහ අනන්‍ය වූ අවබෝධය යි. පුද්ගලයෙකු පිරිමි හෝ ගැහැණු යන සමාජභාවයට අයත් වන අතර, ඒ දෙකටම හෝ ඒ අතර කොතැනකට හෝ අයත් නොවන බවට විශ්වාස කරයි. පුද්ගලයෙකුගේ උපතින් පවරා ඇති ලිංගිකත්වය සමහර අවස්ථාවල දී ඔවුන්ගේ සමාජභාවී අනන්‍යතාවයට නොගැලපේ.

**සමාජභාවී ප්‍රකාශනය:** පුද්ගලයෙකු තම සමාජභාවය පෙන්වන හෝ ප්‍රකාශ කරන ආකාරය සමාජභාවී ප්‍රකාශනය ලෙස හැඳින්වේ. මෙයට, හැසිරීමට අමතරව ඇඳුම්, හිසකෙස්, වේශ නිරූපණය, ශරීර භාෂාව සහ කටහඬ වැනි ක්‍රියාවන් සහ භාහිර ප්‍රකාශනයන් ඇතුළත් විය හැකිය. සර්වනාම (Pronouns) සහ පුද්ගලයෙකු තෝරාගත් නම යනු සමාජභාවය ප්‍රකාශ කිරීමට යොදාගන්නා තවත් ක්‍රම දෙකකි. මෙම ලක්ෂණ යනු අනෙකුත් පුද්ගලයන් විසින් යම් පුද්ගලයකුගේ සමාජභාවය තීරණය කරන ආකාරයයි.

**SOGIESC:** මෙය බොහෝ විට ලිංගික දිශානතිය, සමාජභාවී අනන්‍යතාවය, සමාජභාවී ප්‍රකාශනය සහ ලිංගික ලක්ෂණ සඳහන් කිරීමට උද්දේශණය දී භාවිතා වන කෙටි යෙදුමකි. අන්තර් ලිංගික ගුණාංග ඇතුළුව සියලුම සමාජභාවී ප්‍රකාශනයන්, ලිංගික දිශානතියන් සහ ලිංගික ගුණාංග ඇතුළත් වේ. මෙම කෙටි යෙදුමේ ප්‍රභේදනයන් ලෙස SOGI (ලිංගික දිශානතිය, සමාජභාවී අනන්‍යතාවය) හෝ SOGIE ලිංගික දිශානතිය, සමාජභාවී අනන්‍යතාවය සහ සමාජභාවී ප්‍රකාශනය) ගත හැකිය. ලිංගික දිශානතියන් සහ සමාජභාවී අනන්‍යතාවයන් සහිත සිස් සමාජභාවී සහ විෂමරිසි පුද්ගලයන් ඇතුළු සියලුම පුද්ගලයින් මෙම කෙටි යෙදුමට ඇතුළත් කර ඇත.

**LGBTQ :** මෙය සමරිසි පුරුෂ, සමරිසි ස්ත්‍රී, ද්විරිසි, සංක්‍රාන්තික සමාජභාවී පුද්ගලයන් සහ කුවියර් පුද්ගලයන් හඳුන්වන කෙටි යෙදුමකි. Q අක්ෂරය සාමාන්‍යයෙන් උද්දේශණය දී සහ මාධ්‍යයේදී කුවියර් යන තේරුම ගෙන දෙයි, එනමුත්, විශේෂයෙන් තරුණයින් සම්බන්ධව "ප්‍රශ්නගත" (questioning) අවස්ථාව ද මෙයින් අදහස් විය හැකිය.

**සමරිසි ස්ත්‍රී:** වෙනත් කාන්තාවන් වෙත ශාරීරිකව, චිත්තවේගීයව සහ/හෝ අධ්‍යාත්මිකව ආකර්ෂණය වන කාන්තාවකි. සමහර සමරිසි කාන්තාවන් gay හෝ gay කාන්තාවන් ලෙස තමා හැඳින්වීමට කැමති වේ. ඔවුන්ව ''සමලිංගිකයින්'' ලෙස හැඳින්වීම නොකළ යුතු අතර ලෙස්බියන් යන පදය නාම පදයක් හෝ විශේෂණ පදයක් ලෙස භාවිතා කළ හැක.

**සමරිසි පුරුෂ:** තම ලිංගයේම අයෙකුට ශාරීරිකව, චිත්තවේගීයව සහ/හෝ අධ්‍යාත්මිකව ආකර්ෂණය වන පුද්ගලයෙකි. සාමාන්‍යයෙන් පිරිමින් වෙත ශාරීරිකව, චිත්තවේගීයව සහ/හෝ අධ්‍යාත්මිකව ආකර්ෂණය වීම විස්තර කිරීමට භාවිතා කරයි. ඔවුන් සමලිංගිකයන් ලෙස හැඳින්වීම නොකළ යුතු ය.

**ද්විරිසි:** මෙය ශාරීරික, රෝමාන්තික සහ/හෝ චිත්තවේගී මට්ටමින් විවිධ සමාජභාවයන්වල පුද්ගලයන් වෙත ආකර්ෂණය වන පුද්ගලයකු විස්තර කිරීමට භාවිතා කරන විශේෂණ පදයකි, මෙය සමහර විට එකම වේලාවකදී, එකම ආකාරයකින් හෝ එකම ප්‍රමාණයකට නොවිය හැකිය.

**සංක්‍රාන්තික සමාජභාවී පුද්ගලයන්:** මෙය උපතේදී තිබූ ලිංගිකත්වයෙන් වෙනස් වූ සමාජභාවී අනන්‍යතාවයක් සහිත පුද්ගලයන් විස්තර කිරීමට භාවිතා කරන යෙදුමකි. මෙය සාම්ප්‍රදායික සමාජභාවී භූමිකාවන්ට පටහැනිව විවිධ ආකාරවලින් තම සමාජභාවය ප්‍රකාශ කරන පුද්ගලයන් විස්තර කිරීමට භාවිතා කරන ඡත්‍ර පදයකි. එය සංක්‍රාන්ති සමාජභාවී, සංක්‍රාන්ති ලිංගික, විරුද්ධ ලිංගික ඇඳුම් අඳින, සමාජභාවය නොගැලපෙන, සමාජභාවී ප්‍රභේදය, හෝ කුවියර් ලෙස හඳුනාගත් පුද්ගලයන් ඇතුළත් වන නමුත් ඒවාට සීමා නොවේ. එයට සංක්‍රාන්තික සමාජභාවී පිරිමින් සහ කාන්තාවන් ද ඇතුළත් ය. සංක්‍රාන්තික සමාජභාවී පුද්ගලයන් හැඳින්වීමට බොහෝ විට "ට්‍රාන්ස්" යන යෙදුම භාවිතා කෙරේ.

**සංක්‍රාන්තික සමාජභාවී කාන්තාව:** මෙය උපතේදී පිරිමියෙකු ලෙස උපත ලබා, සමාජභාවී අනන්‍යතාවය ගැහැණු වන පුද්ගලයන් විස්තර කිරීමට භාවිතා කරන යෙදුමකි.

**සංක්‍රාන්තික සමාජභාවී පුරුෂයා:** මෙය උපතේදී ගැහැණියක් ලෙස උපත ලබා, සමාජභාවී අනන්‍යතාවය පිරිමි වන පුද්ගලයන් විස්තර කිරීමට භාවිතා කරන යෙදුමකි.

**ප්‍රශ්න ගත:** ඔවුන්ගේ ලිංගිකත්වය හෝ සමාජභාවී අනන්‍යතාවය ප්‍රශ්නගත වූ පුද්ගලයන්

**කුවියර්:** මෙය විෂමරිසි ලෙස හඳුනා නොගන්නා සහ තමන් සමරිසි, හෝ ද්විරිසි ලෙස පමණක් හැඳින්වීමට අකමැති පුද්ගලයින්, විශේෂයෙන් තරුණ පුද්ගලයින් විස්තර කිරීමට භාවිතා කරන යෙදුමකි.

**විෂමරිසි:** මෙය ශාරීරිකව, රෝමාන්තිකව සහ/ හෝ චිත්තවේගීව තමන්ට වඩා වෙනස් ලිංගිකත්වයකට අයත් අයෙකුට ආකර්ෂණය වන පුද්ගලයින් විස්තර කිරීමට භාවිතා කරන යෙදුමකි.

**සමලිංගික:** මෙය තමා හා සමාන ලිංගිකත්වයකට අයත් අයකු වෙත ශාරීරිකව, චිත්තවේගීයව සහ/හෝ රෝමාන්තිකව ආකර්ෂණය වන පුද්ගලයින් විස්තර කිරීමට භාවිතා කරන යෙදුමකි. මෙය යල්පැන ගිය සායනික යෙදුමක් වන අතර එය නින්දා සහගත ලෙස සැලකේ. The Associated Press , The New York Times සහ The Washington Post විසින් මෙම පදය භාවිතා කිරීම සීමා කර ඇත.

**ඒකලිංගික:** විශේෂයෙන්ම විෂමරිසි හෝ සමරිසි.

**අන්තර් ලිංගික:** මෙය පිරිමි හෝ කාන්තා ශරීර පිළිබඳ සාම්ප්‍රදායික සංකල්පවලින් බැහැර වන ලිංගික අවයව, අභ්‍යන්තර ප්‍රජනක අවයව සහ වර්ණදේහ ඇතුළු සහජ ජීව විද්‍යාත්මක ලිංගික ලක්ෂණ එකක් හෝ කිහිපයක් ඇති පුද්ගලයන් විස්තර කිරීමට භාවිතා කරන යෙදුමකි. මෙය සංක්‍රාන්තික සමාජභාවී පුද්ගලයන් සමඟ පටලවා නොගත යුතුය. අන්තර්ලිංගික පුද්ගලයින්ට උපතේදී පිරිමි හෝ ගැහැණු වශයෙන් ලිංගිකත්වයක් පවරනු ලබන අතර වෛද්‍ය සේවකයන් සහ දෙමාපියන්ගේ එම තීරණය දරුවාගේ සමාජභාවී අනන්‍යතාවයට නොගැලපිය හැකිය.

**පිරිමි-** මෙය සාමාන්‍යයෙන් ස්ත්‍රියකගේ බිත්තර සංසේචනය කළ හැකි කුඩා, නිතර චලනය වන ගැමට් නිපදවිය හැකි ලිංගයේ පුද්ගලයෙකි. උපතේදී පුරුෂයකු ලෙස උපත ලැබූ සමහර පුද්ගලයන්ට, ඊට වෙනස් සමාජභාවී අනන්‍යතාවයක් තිබිය හැක.

**ගැහැණු -** මෙය සාමාන්‍යයෙන් දරුවකු බිහි කිරීමට හැකියාව ඇති ලිංගිකත්වයේ පුද්ගලයෙක් හැඳින්වීමට යොදාගනී. උපතේදී ස්ත්‍රියක් ලෙස උපත ලැබූ ඇතැම් පුද්ගලයන්ට, ඊට වෙනස් සමාජභාවී අනන්‍යතාවයක් තිබිය හැක.

**සංක්‍රාන්ති ලිංගික:** මෙය වෛද්‍ය සහ මනෝවිද්‍යාත්මක ක්ෂේත්‍රවලින් ආරම්භ වූ පදයක් වන අතර, ඔවුන්ගේ ශරීර වෙනස් කිරීමට කැමති අය හෝ ඔවුන්ගේ ශරීර වෙනස් කිරීම සඳහා හෝමෝන ප්‍රතිකාර ඇතුළු වෛද්‍ය ක්‍රියා පටිපාටි සිදු කර ඇති අය හැඳින්වීමට යොදා ගනියි. මෙය බහුලව භාවිතා වන යෙදුමක් නොවන අතර සංක්‍රාන්තික සමාජභාවී පුද්ගලයන් සංක්‍රාන්ති ලිංගිකයන් ලෙස හඳුනා නොගනී.

**සිස් සමාජභාවී:** මෙය උපතේදී තමා හඳුන්වා ඇති ලිංගිකත්වයට අනුරූප වන සමාජභාවයක් සහිත, එනම් සංක්‍රාන්තික සමාජභාවී නොවන, පුද්ගලයෙකු හඟවන හෝ අදාළ වන පදයකි.

Misgender: මෙය විශේෂයෙන්ම, තමාගේ සමාජභාවී අනන්‍යතාවය පිළිඹිබු නොකරන සර්වනාමයක් හෝ යම්කිසි ආමන්ත්‍රණයක් සහිත සංක්‍රාන්තික සමාජභාවී පුද්ගලයකු හැඳින්වීමට භාවිතා කරන යෙදුමකි.

**පරණ නාමය:** බොහෝ විට ක්‍රියා පදයක් ලෙස භාවිතා වන අතර මෙය සංක්‍රාන්තික සමාජභාවී පුද්ගලයන් තම සමාජභාවී සංක්‍රාන්තියේ කොටසක් ලෙස තම නම වෙනස් කර ඇති විට ඔවුන්ගේ උපන් නාමයෙන් ආමන්ත්‍රණය කිරීම වේ.

**විරුද්ධ ලිංගික ඇඳුම් අඳින පුද්ගලයා (cross dresser) :** මෙය සාමාන්‍යයෙන් වෙනත් සමාජභාවයක පුද්ගලයන් විසින් අඳින ඇඳුම් අඳින පුද්ගලයන්, සාමාන්‍යයෙන් කාන්තා ඇඳුම්, මේකප්, ආභරණ යනාදිය අඳින පිරිමියෙකු විස්තර කිරීමට භාවිතා කරන යෙදුමකි. තම සමාජභාවී අනන්‍යතාවය ප්‍රකාශ කිරීමට මෙසේ විරුද්ධ ලිංගික ඇඳුම් ඇඳිය හැකි අතර තවත් සමහරු මෙය කලාවක් ලෙස භාවිතා කරයි. කෙසේ වෙතත්, එම පුද්ගලයා තමන්ව එසේ හඳුන්වන්නේ නම් මිස, LGBTQ පුද්ගලයෙකු විස්තර කිරීමේදී විරුද්ධ ලිංගික ඇඳුම් අඳින යන යෙදුම භාවිතා කිරීම සුදුසු නොවේ.

**ද්විමය නොවන:** ද්විමය නොවන යනු තම සමාජභාවී අනන්‍යතාවය සහ/හෝ සමාජභාවී ප්‍රකාශනය පුරුෂ සහ ස්ත්‍රී යන ද්විමය වන සමාජභාවී කාණ්ඩයන් දෙකට අයත් නොවන බව විශ්වාස කරන පුද්ගලයන් විස්තර කිරීමට භාවිතා කරන යෙදුමකි. Enby යනු ද්විමය නොවන යන්නෙහි සංක්ෂිප්ත ආකාරයකි. එය සාමාන්‍යයෙන් කළු ජාතික නොවන non-Black අය සඳහා වන කෙටි යෙදුමක් වන බැවින්, NB යන යෙදුම භාවිතා කිරීම සුදුසු නොවේ.

Androsexual/Androphilic: මෙය ලිංගිකව, සෞන්දර්යාත්මකව, සහ/හෝ රෝමාන්තිකව පුරුෂත්වයට ආකර්ෂණය වන පුද්ගලයන් විස්තර කිරීමට භාවිතා කරන යෙදුමකි.

Gynesexual/gynephilic: මෙය ලිංගිකව, සෞන්දර්යාත්මකව, සහ/හෝ රෝමාන්තිකව ස්ත්‍රීත්වයට ආකර්ෂණය වන පුද්ගලයන් විස්තර කිරීමට භාවිතා කරන යෙදුමකි.

**රෝමාන්තික නොවන:** මෙය කිසිවෙකු කෙරෙහි රෝමාන්තික ආකර්ෂණයක් නැති පුද්ගලයින් හැඳින්වීමට භාවිතා කරන යෙදුමකි. යමෙකු සමඟ දැඩි චිත්තවේගීය හෝ ලිංගික සම්බන්ධතාවක්

ඇති කර ගැනීම ඇරුණු කොට, ආදර ආකර්ෂණයක් නොදැනෙන පුද්ගලයින් මෙයට ඇතුළත් විය හැකිය.

**ආලිංගික:** මෙය කිසිවෙකු කෙරෙහි ලිංගික ආකර්ෂණයක් ඇති නොවන පුද්ගලයින් හැඳින්වීමට භාවිතා කරන යෙදුමකි. සමහර විට මෙය "ace" ලෙස කෙටි කර ඇත.

**අර්ධ ලිංගික:** මෙය ලිංගික ආකර්ෂණය සමහර අවස්ථාවන්හී දී පමණක් අත්විඳින පුද්ගලයින් විස්තර කිරීමට භාවිතා කරන යෙදුමකි, උදාහරණයක් ලෙස, ඔවුන් සහකරුවෙකු සමඟ ශක්තිමත් චිත්තවේගීය හෝ රෝමාන්තික සම්බන්ධතාවයක් ඇති කර ගත් පසු ව පමණක් ලිංගික ආකර්ෂණය ඇති වන පුද්ගලයන් ගත හැකිය. මෙය බොහෝ විට ආලිංගික කුලකය යටතේ භාවිතා වේ.

Pansexual: මෙය සමාජභාවය නොසලකා, මිනිසුන්ට කායික, රෝමාන්තික සහ/හෝ චිත්තවේගීය ආකර්ෂණයන් ඇති කර ගැනීමේ හැකියාව ඇති පුද්ගලයින් විස්තර කිරීමට භාවිතා කරන යෙදුමකි. මෙය bi+ කුලකය යටතේ ඇති පද කිහිපයෙන් එකකි.

**හිතකාමී පුද්ගලයා (Ally):** මෙය LGBTQ පුද්ගලයන්ට සහාය දක්වන සහ ඔවුන්ට පක්ෂව කතා කරන විෂමරිසි සහ/හෝ සිස් සමාජභාවී පුද්ගලයෙකි. බහු වචන allies ය.

**පිටතට නොපැමිණි (Closeted):** තම ලිංගික දිශානතිය සහ/හෝ සමාජභාවී අනන්‍යතාවය ප්‍රසිද්ධියේ පිළිනොගත් හෝ තමා LGBTQ වීම පිළිබඳව සමාජය නොදන්නා පුද්ගලයන් විස්තර කිරීමට භාවිතා කරන යෙදුමකි.

**පිටතට පැමිණීම:** මෙය ඉතා දීර්ඝ ස්වයං-පිළිගැනීමේ ක්‍රියාවලියක් විය හැකිය. මිනිසුන් තම ලිංගික දිශානතිය මුලින්ම අවබෝධ කර, එය පිළිගෙන, ඉන්පසු එය අන් අයට හෙළි කරයි. LGBTQ ලෙස පිටතට පැමිණීමට ලිංගික අත්දැකීම් තිබීම අවශ්‍ය නොවන බවත්, එය අන් අයට පැවසීම අවශ්‍ය නොවන බවත් විශේෂයෙන් අවධාරණය කෙරේ.

**සමරිසි භීතිකාව:** කථාවෙන් හෝ ක්‍රියාවෙන් ප්‍රකාශ වන, සමරිසි, ද්විරිසි, හෝ කුවියර් මිනිසුන් කෙරෙහි  ඇති පක්ෂග්‍රාහීත්වය, අගතිය හෝ වෛරය හැඳින්වීමට භාවිතා කරන යෙදුමකි.

**ද්විරිසි භීතිකාව:** කථාවෙන් හෝ ක්‍රියාවෙන් ප්‍රකාශ වන, ද්විරිසි මිනිසුන් කෙරෙහි  ඇති පක්ෂග්‍රාහීත්වය, අගතිය හෝ වෛරය හැඳින්වීමට භාවිතා කරන යෙදුමකි. ඔබ "එය සැබෑ නොවේ", "එය යම් අදියරක් පමණි" වැනි ද්විරිසි භාවයේ නීත්‍යානුකූලභාවය පිළිබඳ සැකය පිළිඹිඹු වන අදහස් මෙයට උදාහරණ වේ.

**සංක්‍රාන්තික සමාජභාවී භීතිකාව:** වෙනස් කොට සැලකීමේ වචන, කථාවෙන් හෝ ක්‍රියාවෙන් ප්‍රකාශ වන, සංක්‍රාන්තික සමාජභාවී පුද්ගලයන් කෙරෙහි ඇති අගතිය සහ වෛර හැඳින්වීමට භාවිතා කරන යෙදුමකි.

**සමාජභාවී සර්වනාම:** මෙමගින්, පුද්ගලයන් තම සමාජභාවී අනන්‍යතාවය පිළිබිඹු කර, තමන්ව හැඳින්වීමට භාවිතා කරන යෙදුම් හඳුන්වයි. මේවා he/him, she/her හෝ they/them වැනි සමාජභාවය නොහැඟවෙන මධ්‍යස්ථ වචන විය හැකිය.

**ලිංගික කැමැත්ත:** මෙයට ලිංගික දිශානතියට සමාන නිර්වචනයක් ඇති නමුත්, එය අපහාසාත්මක යෙදුමක් ලෙස සලකනු ලබන අතර එය භාවිතා කිරීම සුදුසු  නොවේ. විෂමරිසි වීම හැර වෙනත් යම්  ලිංගික දිශානතියක් පැවතීම, තෝරා ගැනීමක් වන අතර, "සුව කළ හැකි" බව එයින් ගම්‍ය වේ.

## <u>මාධ්‍ය වචන සඳහා යාවත්කාලීන කරන ලද දේශීය භාෂාව</u>

**ප්‍රේක්ෂක :** මෙයින් අදහස් කරන්නේ මාධ්‍යය හෝ අන්තර්ගතය නිර්මාණය කරන ලද ඉලක්කගත ප්‍රේක්ෂකයින් සහ එයට නිරාවරණය වන අනෙක් සියලුම දෙනාය.

**ජනවිකාසඃ** මෙය මාධ්‍ය පරිශීලකයන්ගේ වයස, සමාජභාවය, ලිංගික දිශානතිය, ජාතිය, ජාතිකත්වය, අධ්‍යාපන මට්ටම සහ ආදායම වැනි ප්‍රාමාණික ලක්ෂණ හඳුන්වයි.

**මතවාදයඃ** මිනිසුන් බාහිර ලෝකය සහ ඔවුන්ගේ වටපිටාව දකින ආකාරය ගැන කතා කරයි. පුද්ගල මනෝවිද්‍යාවන් සහ අප වටා ගොඩනැගී ඇති සමාජ ව්‍යුහයන් මේ ආකාරයෙන් අන්‍යෝන්‍ය ලෙස ක්‍රියා කළ හැකිය.

**මාධ්‍ය :** සමස්තයක් ලෙස මාධ්‍ය යනු ජන සන්නිවේදනයේ සෑම කාර්මික ආකාරයක්ම වේ.

**මාධ්‍ය අධ්‍යාපනයඃ** මාධ්‍ය නිෂ්පාදනයට අදාළ තාක්ෂණික නිෂ්පාදන හැකියාවන් ඉගෙන ගැනීමේ ක්‍රමවේදය යි.

**මාධ්‍ය සාක්ෂරතාවඃ** ක්‍රියාශීලී ලෙස මාධ්‍ය අවබෝධ කර ගැනීමේ සහ භාවිතා කිරීමේ ක්‍රියාවලියයි. මාධ්‍යවල ස්වභාවය, ඒවායේ ක්‍රමවේදයන් සහ එම ක්‍රමවේද වල ප්‍රතිඵල පිළිබඳව මනා අවබෝධයක් තිබීම මෙයින් අදහස් කෙරේ.

**ජන මාධ්‍යඃ** තාක්ෂණය භාවිතා කර විශාල ප්‍රේක්ෂක පිරිසක් විසින් පරිභෝජනය කිරීමට අදහස් කරන මාධ්‍ය, ජන මාධ්‍ය ලෙස හඳුන්වයි.

**සමාජ මාධ්‍යඃ** පරිශීලකයින්ට තොරතුරු ප්‍රකාශ කිරීමට, සමාජ ජාලකරණයට සහභාගී වීමට හෝ ඒ දෙකටම හැකියාව ලබා දෙන යෙදුම් සහ වෙබ් අඩවි සමාජ මාධ්‍ය ලෙස හඳුන්වයි. සමාජ මාධ්‍ය යෙදුම් වලට Facebook, Instagram සහ TikTok ඇතුළත් වේ.

**සමාජ මාධ්‍ය ප්‍රවේශයඃ** සමාජ මාධ්‍යවල හුවමාරු වන කරුණු නරඹන පුද්ගලයින්ගේ ප්‍රමාණය සමාජ මාධ්‍ය ප්‍රවේශය ලෙස හැඳින්වේ. එය පරිශීලකයන් සමාජ මාධ්‍ය වල අඩංගු තොරතුරු නරඹන ආකාරය සහ ඒවා සමඟ සම්බන්ධ වන ආකාරය නිරූපණය කරන, සමාජ මාධ්‍ය මිනුම් වලින් එකකි.

**සමාජ මාධ්‍ය අලෙවිකරණයඃ** සමාජ මාධ්‍ය අලෙවිකරණය යනු වෙළඳනාම සහ අලෙවිකරණ අරමුණු සපුරාලීම සඳහා සුප්‍රසිද්ධ සමාජ මාධ්‍ය වේදිකා භාවිතා කරන ඩිජිටල් අලෙවිකරණ වර්ගයකි.

**මාධ්‍යවේදීන්ඃ** ගුවන්විදුලිය හෝ රූපවාහිනිය සඳහා ප්‍රවෘත්ති වාර්තා හෝ ලිපි නිෂ්පාදනය කරන හෝ ඒවා පුවත්පතකට හෝ සඟරාවකට ලියන පුද්ගලයින්.

**සමාජ මාධ්‍යයේ බලපෑම් කල හැකි පුද්ගලයින් (Influencers)ඃ** සමාජ මාධ්‍ය තුළ යම් විෂයයක් පිළිබඳ ඔවුන්ගේ දැනුම සහ ප්‍රවීණත්වය සඳහා නමක් ඇති පුද්ගලයින් ය. ඔවුන් එම විෂය පිළිබඳව ඔවුන් ප්‍රිය කරන සමාජ මාධ්‍ය වේදිකාවල නිතර පළ කරන අතර, ඔවුන්ගේ අදහස් සමීපව අනුගමනය කරන උද්යෝගිමත්, ක්‍රියාකාරී අනුගාමිකයින්ගේ සැලකිය යුතු ප්‍රමානයක් ගොඩනගා ගනියි. ඔවුන්ට නව ප්‍රවණතා ආරම්භ කිරීමට සහ ඔවුන් ප්‍රචාරණය කරන භාණ්ඩ මිලදී ගැනීමට ඔවුන්ගේ අනුගාමිකයින් පෙළඹවිය හැකි නිසා, වෙළඳ නාමයන් මොවුන්ව අගය කරයි.

**ඩිජිටල් අන්තර්ගත නිර්මාතෘ:** දෘශ්‍යමය වශයෙන් සිත් ඇදගන්නාසුළු සහ ප්‍රේක්ෂකයන් ආකර්ෂණය කරන අන්තර්ගතයන් නිෂ්පාදනය කරන පුද්ගලයන්. මොවුන් බොහෝ විට සමාජ මාධ්‍ය වේදිකා සඳහා අන්තර්ගතයන් නිර්මාණය කරයි. සාමාන්‍යයෙන්, මෙම අන්තර්ගතයන් වල පරමාර්ථය වන්නේ මාර්ගගත ප්‍රේක්ෂකයින් පිරිසක් දැනුවත් කිරීම, විනෝදයට පත් කිරීම සහ සතුටු කිරීමයි.

**ආඛ්‍යානය:** කතාව හෝ කතා වස්තුව ඉදිරිපත් කරන ආකාරය. මාධ්‍ය පාඨයක ආඛ්‍යානය යනු එහි සිදුවීම් කාලය සහ අවකාශය මත දිග හැරෙන තාර්කික සැකැස්මයි.

**ඒකාකෘති:** ක්ෂණිකව හඳුනාගත හැකි ගතිලක්ෂණ මත පදනම්ව සමාජ හෝ සංස්කෘතික කණ්ඩායම් වල ලේබල් පුද්ගලයන්ට පැවරීම සඳහා මාධ්‍ය විසින් භාවිතා කරන තාක්ෂණයකි. මාධ්‍ය මගින් ප්‍රේක්ෂකයන් සමඟ සමීපව සම්බන්ධ වීමට, ඒවා සෘණාත්මක සහ සත්‍ය නොවූවද, ඒකාකෘති භාවිතා කරයි.

**මූලාශ්‍ර:** ප්‍රවෘත්තියක් හෝ ලිපියක් පල කරන විට මාධ්‍යවේදියා විසින් සම්මුඛ සාකච්ඡා කරන ලද පුද්ගලයන් හැඳින්වීමට භාවිතා කරන යෙදුමකි.

By-line: කිසියම් ලිපියක ලේඛකයාගේ නම හෝ අන්වර්ථ නාමය හැඳින්වීමට භාවිතා කරන යෙදුමකි (බොහෝ විට මුද්‍රිත මාධ්‍යවල භාවිතා වේ)

]

# ප්‍රේක්ෂකයන්

මෙය LGBTQ හෝ SOGIE ගැටළු සම්බන්ධ ගැටළු වාර්තා කිරීමේදී ප්‍රධාන මුද්‍රණ, විකාශන, සමාජ මාධ්‍ය වේදිකා, ඩිජිටල් අවකාශයන් ඇතුළු සියලුම මාධ්‍ය ආයතන සඳහා අත්පොතක් ලෙස ක්‍රියා කිරීමට නිර්මාණය කර ඇති මාධ්‍ය යොමු මාර්ගෝපදේශයකි. විවිධ SOGIE සහ LGBTQ ප්‍රජාවට එරෙහි අපකීර්තියට පත්කිරීම්, වෙනස්කොට සැලකීම් සහ හිරිහැර කිරීම් සහ ප්‍රචණ්ඩත්වයන් පවත්වාගෙන යන නියමයන්, සංකල්ප සහ මතවාදයන් භාවිතය අවම කිරීම පොත් පිංචේ අරමුණ බැවින්, මෙම පොත් පිංචේ ප්‍රේක්ෂකයන් නිශ්චිතව හඳුනා ගැනීම අත්‍යාවශ්‍ය වේ.

**මාධ්‍ය ආයතන ඉලක්ක කරන්නේ කුමක් ද?**

Media යනු medium හි බහු වචනය ලෙස අර්ථ දැක්වේ; මෙම පදය ජන සන්නිවේදනයේ සියලුම කාර්මික ආකාර ඒකාබද්ධ කිරීමට අදහස් කරයි.

තාක්ෂණ නියෝජිතායතන (මුද්‍රිත මාධ්‍ය, රූපවාහිනිය සහ ගුවන්විදුලිය ඇතුළුව) හරහා, විශාල ප්‍රේක්ෂකයින් පිරිසක් විසින් පරිශීලනය කිරීමට සැලසුම් කර ඇති මාධ්‍ය සහ, නවතම සහ වේගයෙන් දියුණු වන සමාජ මාධ්‍ය ද ජන මාධ්‍යයට ඇතුළත් වේ.

ඉහත සඳහන් ඕනෑම මාධ්‍යයකින් LGBTQ පුද්ගලයින්ගේ කථා පැවසීම සඳහා සහ එම ප්‍රජාවට අදාළ ගැටළු සාකච්ඡා කිරීම සඳහා සම්බන්ධ සියලුම පුද්ගලයින් මෙම යොමු මාර්ගෝපදේශයේ ඉලක්කගත ප්‍රේක්ෂකයින් ලෙස සැලකේ.

මෙම මාධ්‍ය යොමු මාර්ගෝපදේශය මුද්‍රිත/විද්‍යුත් මාධ්‍ය ආයතන, වීඩියෝ මාධ්‍ය ආයතන, රූපවාහිනිය, ගුවන්විදුලිය, මාධ්‍යවේදීන්, අන්තර්ගත නිර්මාණකරුවන්, සංස්කාරකවරුන්, මුද්‍රිත/විද්‍යුත් මාධ්‍ය ආයතනවල උප සංස්කාරකවරුන්, රූපවාහිනී සහ ගුවන්විදුලි ආයතනවල සංස්කාරකවරුන්, සමාජ මාධ්‍යයේ බලපෑම් කල හැකි පුද්ගලයින්, සමාජ මාධ්‍ය කළමනාකරුවන් සඳහා වැදගත් මාර්ගෝපදේශයන් ලැයිස්තුගත කරයි..

**මෙම යොමු මාර්ගෝපදේශය ජන මාධ්‍යයට උපකාර කරන්නේ කෙසේද?**

ශ්‍රී ලංකාවේ ජනමාධ්‍ය ප්‍රධාන වශයෙන් පාලනය වන්නේ ශ්‍රී ලංකා පුවත්පත් මණ්ඩලය මගිනි. මාධ්‍යකරණය ඉහළම ප්‍රමිතීන් පවත්වාගෙන යමින් නිදහස් මාධ්‍ය පාඨකයන්ගේ අවශ්‍යතා සහ අපේක්ෂාවන්ට වගකිව යුතු සහ සංවේදී බව සහතික කිරීමට අවශ්‍ය වන පරාමිතීන් ඇත.

මෙම පරිචය තුළ, LGBTQ ප්‍රජාව වැනි ආන්තීකරණයට ලක්වූ කණ්ඩායම්, වලට එරෙහිව පවතින සමාජ අපකීර්තීන් අවුස්සන, සෘණාත්මක, වෙනස් කොට සලකන සහ අවමන් සහගත රාමුවක් තුළ නිරූපණය නොවන බව හඳුනා ගැනීම වැදගත්ය. සාම්ප්‍රදායික මාධ්‍ය විසින් LGBTQ ප්‍රජාව සෘණාත්මක ලෙස නිරූපණය කර ඇති බවට වන උදාහරණ මීළඟ පරිච්ඡේදයේ සාකච්ඡා කෙරෙනු ඇත. එබැවින්, මෙය LGBTQ ප්‍රජාව වටා ඇති ගැටළු වාර්තා කිරීමේදී වගකිවයුතු සහ සංවේදී භාවිතයන් ක්‍රියාත්මක කිරීම සඳහා පුවත්පත්, සඟරා, රූපවාහිනී, ගුවන්විදුලි මධ්‍යස්ථාන සහ අනෙකුත් සියලුම සම්ප්‍රදායික මාධ්‍යවලට උපකාර වන සහ දිරිමත් කරන යොමු මාර්ගෝපදේශයකි.

**යොමු මාර්ගෝපදේශය සමාජ මාධ්‍යවලට උපකාර කරන්නේ කෙසේද?**

වර්තමාන සන්දර්භය තුළ සමාජ මාධ්‍යවල දෘශ්‍යතාව අතිශයින් ඉහළ මට්ටමක පවතින අතර සමාජ මාධ්‍ය තුළ පුද්ගලයන්ගේ අන්තර්ගතයන් පිළිබඳ වගවීම ද වැඩි වෙමින් පවතී. සමාජ මාධ්‍යයේ බලපෑම් කල හැකි පුද්ගලයින් සහ සමාජ මාධ්‍ය ප්‍රවර්ධනය කරන සංවිධානයන් LGBTQ පුද්ගලයන්ට අදාළ කරුණු සහ ගැටළු වාර්තා කිරීමේදී වෘත්තීයභාවය පවත්වා ගනිමින්, අපක්ෂපාතීව සිටිය යුතු අතර හිරිහැර කිරීම් සහ ප්‍රචණ්ඩත්වය කුපිත කිරීමෙන් සහ ප්‍රජාවට එරෙහිව විවිධ අපකීර්තියන් සහ අගතීන් ප්‍රවර්ධනය කරන ප්‍රකාශයන් සහ අදහස් සඳහන් කිරීමෙන් වැළකී සිටිය යුතුය.

සමාජ මාධ්‍ය හරහා තථ්‍ය කාලීන සන්නිවේදනයට අවසර දී ඇති අතර, සමාජ මාධ්‍යයේ බලපෑම් කල හැකි පුද්ගලයින් ඇතුළු පුද්ගලයන් සමාජ මාධ්‍ය තුළ හැසිරෙන විට යම් පරාමිතීන් සකසා තිබීම වැදගත් වේ. මෙම යොමු මාර්ගෝපදේශය LGBTQ පුද්ගලයන්ට අදාළ අන්තර්ගතයන් හෝ ඔවුන් සම්බන්ධ ගැටළු සමාජ මාධ්‍ය හරහා ප්‍රකාශ කර හෝ බෙදා ගන්නා විට, ඔවුන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සඳහා මාර්ගෝපදේශ මාලාවක් ලෙස ක්‍රියා කරනු ඇත.

2022 GLAAD සමාජ මාධ්‍ය ආරක්ෂණ දර්ශකයේ (SMSI)[1] LGBTQ පරිශීලකයන් සඳහා වන වෛරය සහ හිරිහැර වලින් පැහැදිලි ආරක්ෂාව පිළිබඳ සමාජ මාධ්‍ය වේදිකා සමාලෝචනයක් සිදු කරන ලදී, මෙයට සමාජමාධ්‍ය profile වලට සමාජභාවීය සර්වනාම ඇතුළත් කිරීම සහ LGBTQ පුද්ගලයින්ට හානිකර සහ/හෝ වෙනස් කොට සැලකීම් සිදු කරන වෙළඳ දැන්වීම් තහනම් කිරීම ද ඇතුළත් විය. මෙයට සියලුම සමාජමාධ්‍ය වේදිකා ලකුණු 50 ට අඩු වීම පුදුමයට පත්වන සහ භයානක කරුණක් විය.

උදාහරණයක් ලෙස Instagram හි ඉලක්කගත පරිශීලකයන්ගේ පැරණි නාමය භාවිතා කිරීම සහ සමාජභාවය වැරදි ලෙස නිරූපණය කිරීමට එරෙහිව නීති නොමැත. පරිශීලකයින්ට ඔවුන්ගේ profile තුළ සර්වනාම එකතු කිරීමට ඉඩ සලසන විශේෂාංගයක් ඇතත්, දැනට සියලුම පරිශීලකයින්ට එය භාවිතා කළ නොහැකි බව සමාගම පිළිගනී. මීට අමතරව, පරිශීලකයින්ට ඔවුන්ගේ සමාජභාවී සර්වනාම බැලිය හැක්කේ කාටද යන්න සීමා කිරීම සඳහා ඉතා සුළු විකල්ප ප්‍රමාණයක් ලබා දෙයි. Instagram විසින් එම පරිශීලකයින්ගේ ලිංගික දිශානතිය සහ සමාජභාවී අනන්‍යතාවය පිළිබඳ තොරතුරු සමාගම විසින් රැස් කරන සහ අඩු කරන ආකාරය සම්බන්ධයෙන් පරිශීලකයින්ට ඇති තේරීම් පිළිබඳ සීමිත තොරතුරු ප්‍රමාණයක් සපයයි. Meta හි ඉලක්කගත ප්‍රචාරණ ප්‍රමිතීන්ට අනුව, ලිංගික දිශානතිය හා සම්බන්ධ විෂයයන් වැනි සංවේදී විෂයයන් මත පදනම් වූ ඉලක්කගත වෙළඳ ප්‍රචාරණ ක්‍රම භාවිතා කිරීම තහනම් කර ඇත. කෙසේ වෙතත්, සමාගම නිශ්චිත වූ පරිශීලක-පදනම් ඉලක්ක කිරීමට ඉඩ නොදෙන බව පෙන්නුම් කරමින්, සංසන්දනාත්මක අනාවරණයක් සොයා ගැනීමට නොහැකි විය.

එබැවින්, සමාජ හරහා LGBTQ පුද්ගලයන්ට සිදුවන වෙනස්කම් කිරීම් සහ හිරිහැර වැළැක්වීමේ සහ අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේ පරාමිතීන් සැරිසැරීමට මෙම යොමු මාර්ගෝපදේශය පැහැදිලි සහ පුළුල් මාර්ගෝපදේශ මාලාවක් සපයයි.

[1] https://sites.google.com/glaad.org/smsi/platform-scores?pli=1

# මාධ්‍ය ආචාර ධර්ම පිළිබඳ දළ විශ්ලේෂණයක්

## <u>සාමාන්‍ය මාධ්‍ය ආචාර ධර්ම</u>

### 1. මාධ්‍යවේදීන් සඳහා වන ආචාර ධර්ම සංග්‍රහය

1981 අංක 162/5A දරණ අතිවිශේෂ ගැසට් පත්‍රයේ මාධ්‍යවේදීන් සඳහා වන ආචාර ධර්ම සංග්‍රහය දක්වා ඇත.

ඉහත කී ආචාර ධර්ම සංග්‍රහය මඟින් සෑම මාධ්‍යවේදියෙකුම, මුද්‍රණකරුවකුම, විකාශන සංස්ථාවන් සහ සියලු ආකාරයේ මාධ්‍යයන් විසින් අනුගමනය කළ යුතු රෙගුලාසි සපයයි. එම මාර්ගෝපදේශවල සාරාංශයක් පහත පරිදි වේ;

- අසත්‍ය තොරතුරු වාර්තා කිරීමෙන් වැළකීම, මහජන රුචිකත්වයට හෝ සදාචාරයට හානි කළ හැකි හෝ මහජන රුචිකත්වයේ හෝ සදාචාරයේ ප්‍රමිතීන් විනාශ කරමින් අන්තර්ගතය විකෘති කිරීමෙන් වැළකීම.
- සත්‍ය ප්‍රකාශයක් සහ මතයක් හෝ විවේචනයක් අතර වෙනස පැහැදිලි කර ගැනීමට තම සාධාරණ උපක්‍රම භාවිතා කිරීමට සෑම මාධ්‍යවේදියෙකුම වගකිව යුතුය 1981 අංක 162/5A අතිවිශේෂ ගැසට් පත්‍රයේ 3 වැනි වගන්තිය).
- එම මූලාශ්‍ර තොරතුරු හෙළි කිරීමට අකැමති නම් මූලාශ්‍රවල රහස්‍යභාවය පවත්වා ගත යුතුය.
- මහජන අවශ්‍යතාවය සඳහා මිස පුද්ගලයන් පිළිබඳ පුද්ගලික තොරතුරු හෙළි කිරීමෙන් වැළකීම.
- අපරාධ වාර්තා කිරීම සම්බන්ධයෙන් මහජන අවශ්‍යතාවය සඳහා මිස පහත දේවලින් වැළකීම;
    1. ලිංගික අපරාධවලට ගොදුරු වූවන්ගේ නම් හෙළිදරව් කිරීම
    2. සාපරාධී වැරදි වලට ලක් වූ තරුණ චූදිතයන් නම් කිරීම
    3. අපරාධයක් සම්බන්ධයෙන් චූදිතයෙකුගේ හෝ වරදකරුවෙකුගේ ඥාතීන් වන පුද්ගලයින් නම් කිරීම.

- තොරතුරු සොරකම් කිරීමෙන් සහ ප්‍රචණ්ඩත්වය ප්‍රවර්ධනය කළ හැකි තොරතුරු වාර්තා කිරීමෙන් වැළකීම.
- මහජන අවශ්‍යතාවය සඳහා මිස අසභ්‍ය කරුණු පළ කිරීමෙන් වැළකීම,
- වාර්ගික හෝ ආගමික අසමගිය හෝ ප්‍රචණ්ඩත්වය ප්‍රවර්ධනය කිරීමෙන් වැළකීම.
- මාධ්‍යවේදීන්ගේ සහ මාධ්‍ය ආයතනවල ගෞරවය ආරක්ෂා කිරීම සහ ඔවුන්ගේ වෘත්තියේ කීර්තිය ආරක්ෂා කිරීම.

## 2. ශ්‍රී ලංකා පුවත්පත් පැමිණිලි කොමිසම විසින් අනුවර්තනය කරන ලද ශ්‍රී ලංකා කතෘ සංසදයේ වෘත්තීය පුහුණු සංග්‍රහය (ආචාර ධර්ම සංග්‍රහය).

ජනමාධ්‍යකරණයේ ඉහළම ප්‍රමිතීන් පවත්වා ගනිමින් ස්වාධීන වන, වගවන සහ පාඨකයන්ගේ ආශාවන් සහ අපේක්ෂාවන්ට සංවේදී වන බව සහතික කිරීම ශ්‍රී ලංකා කතෘ සංසදයේ වෘත්තීය පුහුණු සංග්‍රහයෙන් (ආචාර ධර්ම සංග්‍රහය) අරමුණු කරයි
ඒ සඳහා පුවත්පත් ;

- නිරවද්‍යතාව සහ වෘත්තීය අඛණ්ඩතාව පවත්වාගැනීම සඳහා උත්සාහ කිරීම
- මහජන යහපත සඳහා වන ගවේෂණාත්මක පුවත්පත් කලාවේ විශිෂ්ටතම සම්ප්‍රදායන් ආරක්ෂා කිරීම,
- වාණිජත්වයෙහි (මුදලෙහි) බලපෑමට හසු නොවීමේ සහ පටු පෞද්ගලික අභිමතාර්ත රහිත වීමේ ගුණයෙන් හෙබි වීම,
- අන් අයගේ අදහස් සැලකිල්ලට ගැනීම සහ සමාජයෙන් නැගෙනා හඬ සිය මාධ්‍යකරණය තුලින් නිරූපණයට උත්සාහ දැරීම,

යන ගුණයන් ගෙන් සමන්විත විය යුතුය.

පැමිණිලි විසඳීමේදී, කතුවරුන් ශ්‍රී ලංකා පුවත්පත් පැමිණිලි කොමිසම (PCCSL) සමඟ සහයෝගයෙන් කටයුතු කිරීම අවශ්‍ය වේ.

මෙම සංග්‍රහය උල්ලංඝණය කර ඇති ප්‍රකාශනයන්, PCCSL වෙත යොමු කරන බව දක්වන ශීර්ෂ පාඨයක් සහිතව, සම්පූර්ණයෙන් කැපවී සහ නිසි ප්‍රමුඛත්වය ලබා දී, යෝජනාව/විනිශ්චය මුද්‍රණය කළ යුතුය.
නිවැරදි වාර්තාකරණය සහ නිවැරදි කිරීම් සහ සමාව ඉල්ලීම්, පිළිතුරු දීමට අවස්ථාව, රහස්‍ය මූලාශ්‍රයන්, සාමාන්‍ය වාර්තාකරණය සහ ලිවීම්, පෞද්ගලිකත්වය, හිරිහැර කිරීම සහ උපක්‍රම සහ අඛණ්ඩතාව පිළිබඳ මාර්ගෝපදේශ මෙම සංග්‍රහය විසින් සැපයේ.[2]

## 3. සමාජ මාධ්‍ය ප්‍රකාශය

#EngageSMinSL යටතේ ක්‍රියා කරන මෙය ශ්‍රී ලංකාවේ වගකීම් සහගත සමාජ මාධ්‍ය භාවිතය සඳහා ආචාර ධර්ම පද්ධතියක් සැකසීමට සංවිධානයන් 16ක් ගනු ලබන ප්‍රයත්නයකි. මෙය, සමාජ මාධ්‍ය හරහා නිදහස් අදහස් ප්‍රකාශ කිරීමේ අයිතියේ අවිවාදිත වටිනාකම හඳුනා ගැනීම, සමාජ මාධ්‍ය තුළ ඇති සදාචාරවත් බව, ඉදිරිගාමී චින්තනය සහිත බව සහ ස්වාධීන බව ද අනුමත මෙන්ම ශක්තිමත් කරයි.

සමාජ මාධ්‍ය වේදිකාවලට පහත වගකීම් පැටවීමට මෙම ප්‍රකාශය අරමුණු කරයි;

- දේශීය භාෂාවෙන් ඇති ලේඛණයන් නවීකරණය සඳහා (සිංහල සහ දෙමළ යන දෙකම) භාෂා ප්‍රවීණතාවය ඉහළ නැංවීම.
- ශ්‍රී ලාංකේය අන්තර්ගතයන් පිළිබඳව පරිශීලකයන් විසින් ජනනය කරන ලද වාර්තා , මෙන්ම ඔවුන්ගේ සමාජභාවය, භාෂා කුසලතාව සහ කාල කලාපයන් හැසිරවීමට නම් කර ඇති පරිපාලකයින් සංඛ්‍යාව පිළිබඳව විවෘත සහ අවංක වීම.
- ප්‍රචණ්ඩත්වය වැඩි වන කාලවලදී තව දුරටත් කෙටි කළ යුතු, කලින් තීරණය කළ කාල රාමුවක් තුළ ශ්‍රී ලාංකීය ලේඛනයන් පිළිබඳ පරිශීලකයන් විසින් ජනනය කරන ලද පැමිණිලි විමර්ශනය කිරීම සහ විසඳීමට කැපවීම් කිරීම.

[2] ශ්‍රී ලංකා පුවත්පත් පැමිණිලි කොමිෂන් සභාව විසින් සම්මත කරන ලද ශ්‍රී ලංකා කර්තෘ සංසදයේ ආචාර ධර්ම (ආචාර ධර්ම සංග්‍රහය)

- ප්‍රචණ්ඩත්වය සහ වෛරය අවුස්සන ලේඛනයන් ඉවත් කිරීම සඳහා සමාජ මාධ්‍ය වේදිකා වලට භාවිතා කල හැකි ප්‍රමිතීන් ප්‍රකාශයට පත් කිරීම.
- භාවිතා කරන ඕනෑම විසඳුමක් වෙනත් අංශවල දී අනුපිටපත් කළ හැකි අතර ඒවා පරිමාණය කළ හැකි බව, ප්‍රතිචාරාත්මක බව සහ තිරසාර බව සහතික කර ගැනීම [3].

**<u>සමාජ මාධ්‍ය වේදිකා තුළදී කළ යුතු සහ නොකළ යුතු දේ</u>**

ශ්‍රී ලංකාවේ LGBTQ පුද්ගලයන්ට සිදුවන වෙනස්කම් සම්බන්ධයෙන් ඇම්නෙස්ටි ඉන්ටර්නැෂනල් විසින් කරන ලද සමීක්ෂණයකින් ඇඟවෙන්නේ LGBTQ පුද්ගලයන්ට එරෙහි ප්‍රචණ්ඩත්වයන්ගෙන් **89%** ක් සමාජ මාධ්‍යයන් ඔස්සේ සිදු වන බවයි[4]. බොහෝ සමාජ මාධ්‍ය වේදිකාවලට, හිරිහැර කිරීම, වෛරී ප්‍රකාශ සිදු කිරීම සහ වෙනස් කොට සැලකීම සම්බන්ධයෙන් ප්‍රජා මාර්ගෝපදේශයන් ලෙස සකස් කර ඇති ඔවුන්ගේම නීති රීති ඇත.

ජාතිය, වාර්ගිකත්වය, ආගමික අනුබද්ධතා, ජාතිකත්වය, කුලය, සමාජභාවය, සමාජභාවී අනන්‍යතාවය, ලිංගික දිශානතිය හෝ බරපතල රෝග හෝ ආබාධිතභාවය ඇතුළත් පුද්ගලයෙකුගේ 'ආරක්ෂිත ලක්ෂණ' මත ෆේස්බුක් හරහා සිදු වන ඍජු ප්‍රහාරයන්[5] ඇතුළත් අන්තර්ගතයන් ෆේස්බුක් විසින් ඉවත් කරනු ලබයි . සමහර විට එවැනි අන්තර්ගතයන් පූර්ව අනතුරු ඇඟවීමක් සහිතව ප්‍රේක්ෂකයා වෙත පිළිගැන්විය හැකිය. LGBTQ පුද්ගලයෙකු අවමන් සහගත ලෙස අනුකරණය කරන අවස්ථා ද ඍජු ප්‍රහාර ලෙස හැඳින්විය හැකිය.

ෆේස්බුක් අන්තර්ගතවල බරපතලකම මත පදනම්ව ෆේස්බුක් ප්‍රජා මාර්ගෝපදේශයන් කොටස් තුනකට වර්ග කරයි. වෙනත් පුද්ගලයෙකුගේ වෛරී සහගත ප්‍රකාශ බෙදාගැනීමේදී, එම ප්‍රකාශය භාවිතා කිරීමට සුදුසුද යන්න සාකච්ඡා කිරීම හෝ ඒ පිළිබඳව දැනුවත් කිරීම සඳහා, එම අරමුණ පැහැදිලි නම් Facebook මෙයට ඉඩ දෙයි.

වයස, කුලය, ආබාධිතභාවය, ජනවර්ග, ජාතිකත්වය, ආගමන තත්ත්වය, සමාජභාවය, ලිංගික දිශානතිය යනාදී ඇතැම් ගුණාංග මත පදනම්ව පුද්ගලයන්ට එරෙහිව ප්‍රචණ්ඩත්වය හෝ වෛරය ප්‍රවර්ධනය කරන වෛරී සහගත ප්‍රකාශයන් සහ අන්තර්ගතයන් Youtube විසින් තහනම් කරනු ලබයි. එවැනි අන්තර්ගතයන් පූර්ව අනතුරු ඇඟවීම් මාලාවකින් පසුව සීමා කෙරෙන අතර, ඒවා දිගටම ක්‍රියාත්මක කළහොත් එම Youtube නාලිකාව ඉවත් කළ හැක.

ජනවාර්ගිකත්වය, ජාතිකත්වය, ආගමන තත්ත්වය, කුලය, සමාජභාවය, ලිංගික දිශානතිය, ආගමික බැඳීම්, වයස, ආබාධිතභාවය යනාදිය මත පදනම්ව මිනිසුන්ට එරෙහිව ප්‍රචණ්ඩත්වය ප්‍රවර්ධනය කිරීම හෝ මිනිසුන්ට ඍජුවම පහර දීම හෝ තර්ජනය කිරීම හෝ මිනිසුන් අමානුෂිකකරණය කිරීමෙන් ආරක්ෂා කිරීම සඳහා Twitter තුළ 'වෛරී හැසිරීම් පිළිබඳ ප්‍රතිපත්තියක්' ඇත.

වෛරී සහගත ප්‍රකාශනයන් නිර්වචනය කිරීම සඳහා Instagram මෙම නීතියම අනුගමනය කරන නමුත්, කළු මුහුණ සහ පොදු යුදෙව් විරෝධී වැනි වෛරී ප්‍රකාශ සඳහා දැඩි නීති තිබේ. එවැනි උල්ලංඝණයන් වලදී අන්තර්ගතය මකා දැමීමට, ගිණුම් අක්‍රිය කිරීමට සහ ශාරීරික හානියක් හෝ මහජන ආරක්ෂාවට තර්ජනයක් තිබේ නම්, නීතිය බලාත්මක කිරීම සඳහා කටයුතු කිරීමට හැකියාව Instagram වලට ඇත. .

---

[3] 2019 කොළඹ සමාජ මාධ්‍ය ප්‍රකාශය -වගකීම් සහගත සමාජ මාධ්‍ය භාවිතය සඳහා ආචාර ධර්ම සංග්‍රහය.
[4] https://www.wfd.org/sites/default/files/2022-03/Final%20Report%20-%2012th%20Jan%202022.pdf
[5] ෆේස්බුක් විසින් ඍජු ප්‍රහාරයක් නිර්වචනය කරන්නේ, ප්‍රචණ්ඩකාරී හෝ අමානුෂික කථා, හානිකර ඒකාකෘති, පහත් ප්‍රකාශ, පිළිකුල් සහගත ප්‍රකාශ, ශාප කිරීමේ ප්‍රකාශ සහ බැහැර කිරීම සඳහා වන ඉල්ලීම් ලෙසය.

වෛරී සහගත ප්‍රකාශන හෝ හැසිරීම Tiktok විසින් නිර්වචනය කරන්නේ, ජාතිය, වාර්ගිකත්වය, ජාතිකත්වය, කුලය, ආගම, සමාජභාවය, ලිංගික දිශානතිය, බරපතල රෝග සහ ආබාධ සහ/හෝ ආගමන තත්ත්වය ඇතුළු ආරක්ෂිත ගුණාංග මත පුද්ගලයෙකුට හෝ කණ්ඩායමකට එරෙහිව තර්ජනය කරන, ප්‍රචණ්ඩත්වය උසිගන්වන හෝ වෙනත් ආකාරයකින් අමානුෂික කරන අන්තර්ගතයක් ලෙස ය.[6]

එබැවින් LGBTQ පුද්ගලයන්ට එරෙහිව අපකීර්තියට පත් කරන, වෙනස් කොට සලකන හෝ වෛරය සහ ප්‍රචණ්ඩත්වය අවුලුවා ලන අන්තර්ගතයන් සමාජ මාධ්‍ය වලින් ඉවත් කරනු ලැබේ. එවැනි අන්තර්ගතයක් ප්‍රවර්ධනය කිරීමට හෝ නොදැනුවත්වම එවැනි අන්තර්ගතයක් ප්‍රවර්ධනය කිරීමට උත්සාහ කර අවධානයට ලක් නොවීමට සමාජ මාධ්‍යයේ බලපෑම් කල හැකි පුද්ගලයන් සැලකිලිමත් විය යුතුය.

ශ්‍රී ලංකා රජය සමාජ මාධ්‍ය සහ විදුලි සංදේශ පනතක් සඳහා ක්‍රියා කරන අතරම, එය සමාජ මාධ්‍ය භාවිතා කරන අයගේ අයිතිවාසිකම් නිසි ලෙස ආරක්ෂා කර, සමාජ මාධ්‍ය භාවිතය සඳහා පැහැදිලි පරාමිතීන් සකසනු ඇත. දැනට ඩිජිටල් අන්තර්ගත නිර්මාණකරුවන්, සමාජ මාධ්‍යයේ බලපෑම් කල හැකි පුද්ගලයන් සහ වෙනත් සමාජ මාධ්‍යවේදීන් (පුරවැසි මාධ්‍යවේදීන් ලෙසද හැඳින්වේ) ඉහත සඳහන් කළ ශ්‍රී ලංකා පුවත්පත් පැමිණිලි කොමිසම විසින් අනුවර්තනය කරන ලද ශ්‍රී ලංකා කතෘ සංසදයේ වෘත්තීය පුහුණු සංග්‍රහය (ආචාර ධර්මංග්‍රහය) මගින් පාලනය වේ.

තවද ඉහත පරිච්ඡේදයේ සාකච්ඡා කර ඇති සමාජ මාධ්‍ය ප්‍රකාශය වැනි මාර්ගෝපදේශ තුළ, එක් එක් සමාජ මාධ්‍ය විසින් දක්වා ඇති ප්‍රජා මාර්ගෝපදේශයන් හැර. ශ්‍රී ලංකාවේ සමාජ මාධ්‍යවල පමණක් ප්‍රකාශිත අන්තර්ගතයන් පාලනය වන විශේෂිත වූ බාහිර මාර්ගෝපදේශ නොමැත.

LGBTQ පුද්ගලයන් පිළිබඳ වාර්තා කිරීම, හානිකර හණ මිටි අදහස් සහ ඒකාකෘති වළක්වා ගැනීම, සංක්‍රාන්තික සමාජභාවී විරෝධී වෛරය සහ සාවද්‍ය තොරතුරු අනාවරණය කිරීම සහ පහත පරිච්ඡේදයේ විස්තාරණය කර ඇති LGBTQ පුද්ගලයින් සමඟ සම්මුඛ සාකච්ඡා පැවැත්වීම පිළිබඳ මාර්ගෝපදේශයන්, ඩිජිටල් අන්තර්ගත නිර්මාණකරුවන්ට සහ සමාජ මාධ්‍යයේ බලපෑම් කල හැකි පුද්ගලයන් වෙත අදාළ වන බව අවධාරණය කළ යුතුය.

Bloggers, සමාජ මාධ්‍ය සහ අන්තර්ගත නිර්මාණකරුවන් සඳහා, අන්තර්ජාලය පිළිබඳව, වන ආචාර ධර්ම පද්ධතිය මත පදනම්ව පහත දැක්වෙන්නේ සමාජ මාධ්‍ය සඳහා අන්තර්ගතයන් නිර්මාණය කිරීමේදී විශේෂයෙන් මතක තබා ගත යුතු මාර්ගෝපදේශ කිහිපයකි[7];

1. ඔබට ඔබේ අදහස් ප්‍රකාශ කිරීමට සහ ඔබේ භාෂණයේ, තොරතුරු ප්‍රකාශනයේ සහ නිදහසේ අදහස් ප්‍රකාශ කිරීමට අයිතියක් ඇති අතර, අනෙකුත් සමාජ මාධ්‍ය භාවිතා කරන්නන්ගේ මෙම අයිතීන් ආරක්ෂා කිරීමට නිර්මාණකරුවෙකු ලෙස ඔබට වගකීමක් ඇත.
2. සමාජයේ සිදුවන දේ පිළිබඳව යාවත්කාලීනව වීම සහ අන්තර්ගත නිර්මාණකරුවකු ලෙස මෙම සිදුවීම් නිරූපණය කරන ආකාරය යන දෙකම ඔබට වගකීමක් ඇත. 430
3. ආරක්ෂා වීම සඳහා ඔබගේ බලපෑම භාවිතා කළ හැකිය. අන්තර්ගත නිර්මාණකරුවකු ලෙස, පුද්ගලයන්ට සහ කණ්ඩායම්වලට වෙනස් කොට සැලකීම කෙරෙහි අවධානය යොමු කිරීම සඳහා ඔබට බලය ඇත. මෙම අධිකාරිය අනිසි ලෙස භාවිතා නොකිරීමට වග බලා ගත යුතුය.
4. අසත්‍ය තොරතුරු සහ වැරදි තොරතුරු බෙදා හැරීමෙන් වැළකීම. යමක් පළ කිරීමට පෙර කරුණු පරීක්ෂා කළ යුතු අතර, ඔබ පළ කරන දේ සඳහා වගකීම භාර ගැනීමට සූදානම් විය යුතුය.

[6] https://www.tiktok.com/community-guidelines?lang=en#38

[7] https://mor10.com/code-of-ethics-for-bloggers-social-media-and-content-creators/

5. යම් කිසි සිදුවීමක් පිළිබඳ ඔබේ ඉදිරිදර්ශනය වටින අතර එය ප්‍රකාශ කළ යුතු නමුත්, එය සත්‍ය කරුණු හෝ සංඛ්‍යාලේඛනයන් සමඟ පටලවා නොගත යුතුය. සෑම විටම ඔබේම හෝ වෙනත් පුද්ගලයෙකුගේ මතය හෝ අර්ථ නිරූපණය පැහැදිලිව ප්‍රකාශ කළ යුතුය.
6. අන්තර්ගත නිර්මාණකරුවකු ලෙස ඔබගේ විශ්වසනීයත්වය සහ අඛණ්ඩතාවය පවත්වා ගැනීම සඳහා, ඔබ ඉදිරිපත් කරන විෂයට හෝ මාතෘකාවට ඔබට ඇති මූල්‍යමය, පුද්ගලික, දේශපාලනික හෝ වෙනත් ඕනෑම සම්බන්ධතාවයක් සැමවිටම හෙළි කළ යුතුය.
7. විශේෂයෙන්ම LGBTQ පුද්ගලයෙක් නම්, ඔබේ මූලාශ්‍රවලට අනතුරක් විය හැකි නම් මිස, විනිවිදභාවය සහතික කිරීම සඳහා ඔබේ මූලාශ්‍ර සැමවිටම හෙළි කළ යුතුය.
8. අවශ්‍ය අවස්ථාවේදී අගය කිරීම කළ යුතුය.
9. යම් ප්‍රකාශයක් උපුටා දැක්වීමේදී හෝ අනුවාදනය කිරීමේදී එහි අපේක්ෂිත අර්ථය ප්‍රකාශ කිරීමට සැමවිටම වග බලා ගත යුතුය.
10. තර්කයක් ඉදිරිපත් කරන විට සෑම විටම, විරුද්ධවාදියාට ඔහුගේ සිදුවීම ඉදිරිපත් කිරීමට අවස්ථාවක් ලබා දිය යුතුය.
11. ඔබගේ වැරදි පිළිගෙන වහාම ඒවා නිවැරදි කිරීමට වග බලා ගත යුතුය.
12. සමාජභාවය සහ ලිංගික දිශානතිය වැනි සංවේදී මාතෘකා ගැන පළ කිරීමේදී ගෞරවාන්විත විය යුතුය.
13. LGBTQ පුද්ගලයන්ට අදාළ අන්තර්ගතයන් පළ කිරීමේදී අවමන් සහගත ආකාරයෙන්, පවතින සමාජ අපකීර්තීන් පිළිබඳව ඇඟවීමට හෝ ඉඟි නොකිරීමට වග බලා ගත යුතුය.

# LGBTQ ප්‍රජාව සඳහා විශේෂිත වූ මාධ්‍ය ආචාර ධර්ම.

ශ්‍රී ලංකා පුවත්පත් මණ්ඩලය හෝ ශ්‍රී ලංකා රජය මගින් LGBTQ පුද්ගලයන්ට අදාළ ගැටළු වාර්තා කිරීමේදී මාධ්‍යකරුවන් සහ මාධ්‍යවේදීන් විසින් අනුගමනය කළ යුතු නිශ්චිත මාර්ගෝපදේශ කිසිවක් ඉදිරිපත් කර නොමැත.

කෙසේ වෙතත්, LGBTQ මාධ්‍යවේදීන්ගේ සංගමය විසින් සකසන ලද LGBTQ Style Book[8] සහ සංක්‍රාන්තික සමාජභාවි මාධ්‍යවේදීන්ගේ සංගමය විසින් සකසන ලද Style guide[9] ඇතුළු විවිධ ජාත්‍යන්තර මාර්ගෝපදේශ ඇත.

ඉහත සඳහන් style guides අනුව, LGBTQ පුද්ගලයන්ට අදාළ කරුණු/ගැටළු වාර්තා කිරීමේදී පහත සඳහන් මාර්ගෝපදේශ/රෙගුලාසි සහ සාමාන්‍ය ආරක්ෂිත පියවරයන් මතක තබා ගත යුතුය.

### *LGBTQ පුද්ගලයන් ගැන වාර්තා කිරීමේදී පොදු මාර්ගෝපදේශ;*

- මූලාශ්‍ර මගින් සංක්‍රාන්තික සමාජභාවී හෝ සමාජභාවය අනනුකූල වන (gender nonconforming) ලෙස විවෘතව හඳුනා ගන්නේ නම්, ඔවුන්ගෙන් විමසා සර්වනාම නිවැරදිව භාවිතා කළ යුතුය.
- විවාදාත්මක හෝ සංවේදී මාතෘකා ගැන ලියන විට එහි ප්‍රතිවිරුද්ධ දෘෂ්ටිකෝණ සෙවිය යුතුය.

### *ගෞරවනීය මාධ්‍ය ආවරණයක් සඳහා වන මාර්ගෝපදේශ;*

- ඔවුන්ගේ ලිංගික දිශානතිය, සමාජභාවී අනන්‍යතාවය සහ සමාජභාවී ප්‍රකාශනය විස්තර කිරීමට ඔවුන් කැමති වචන විමසා දැන ගත යුතුය.
- පුද්ගලයෙකුගේ ලිංගික දිශානතිය හෝ සමාජභාවී අනන්‍යතාවය වාක්‍යයක ආරම්භයේදී පමණක් capitalize කළ යුතුය.
- පරිපාලන ආයතනයක්, පවුලේ සාමාජිකයෙක්, පොලිසිය හෝ මිතුරෙකු විසින්, වැරදි ලෙස ඔවුන්ගේ සමාජභාවය නම් කරන්නේ නම් හෝ ඔවුන්ගේ පැරණි නාමය මගින් ඔවුන් හඳුන්වන්නේ නම්, එම උපුටා දැක්වීම භාවිතා නොකිරීමට වග බලා ගත යුතුය.
- පුද්ගලයෙකු ඉල්ලා සිටින්නේ නම් මිස ඔවුන්ගේ වත්මන් නම සහ නිවැරදි සර්වනාම භාවිතා කල යුතුය.
- මූලාශ්‍රයේ ලිංගික දිශානතිය හෝ සමාජභාවී අනන්‍යතාවය ඔබගේ කතාවට අදාළ නොවේ නම්, එය සඳහන් කිරීමෙන් වැළකිය යුතුය.
- ඔබගේ කතාවට අදාළ අදාළ නොවන්නේ , කෙනෙකුගේ සර්වනාම අවධාරණය නොකළ යුතුය.
- කෙනෙකුගේ සමාජභාවය ඔබගේ කතාවට අදාළ නොවන්නේ නම් එය අවධාරණය නොකළ යුතුය.
- යම් මූලාශ්‍රයක සමාජභාවය හෝ සර්වනාම උපකල්පනය නොකළ යුතුය.

---

8 https://www.nlgja.org/stylebook/

9 https://transjournalists.org/style-guide/

- ඔබගේ මූලාශ්‍ර අනාවරණය නොකළ යුතුය. යම් පුද්ගලයන් සමහර පුද්ගලයන් සමඟ පිටතට පැමිණ ඇති නමුත්, ලිපියකින් ප්‍රසිද්ධියේ ප්‍රකාශ කිරීමට මැලි විය හැක.
- සංක්‍රාන්තික සමාජභාවී පුද්ගලයෙක් තම නව නම යාවත්කාලීන කිරීමට හෝ ලිපියකින් හෝ වාර්තාවකින් යම් යම් තොරතුරු ඉවත් කිරීමට ඔබගෙන් ඉල්ලා සිටින්නේ නම්, එම ඉල්ලීමට ගරු කළ යුතුය.
- වාර්තාකරුවෙකු, කර්තෘවරයෙකු හෝ ලේඛකයෙකු තම නම වෙනස් කරන්නේ නම්, එම පුද්ගලයා ඉල්ලා සිටියහොත්, එම පුද්ගලයාගේගේ නව නම පිළිබිඹු කිරීම සඳහා මාධ්‍ය ආයතනය විසින් අතීත කථා වල bylines යාවත්කාලීන කළ යුතුය.
- ව්‍යුහ විද්‍යාව මත පදනම්ව පුද්ගලයෙකුගේ සමාජභාවය උපකල්පනය නොකළ යුතුය.
- ආක්‍රමණශීලී හෝ නුසුදුසු ප්‍රශ්න නොඇසිය යුතුය.
- සංක්‍රාන්තික සමාජභාවී පුද්ගලයෙකුගේ පැරණි නාමය ඔවුන් ස්වේච්ඡාවෙන් ඉදිරිපත් කරන්නේ නම් මිස, ඒ පිළිබඳව විමසීමෙන් වැළකිය යුතුය.
- LBGTQ පුද්ගලයකුගේ අපරාධ ඉතිහාසය මහජන අවශ්‍යතාවයක් වන අවස්ථාවකදී හැර එවැනි තොරතුරු ඇසීමෙන් හෝ ප්‍රසිද්ධ කිරීමෙන් වැළකිය යුතුය.

***හානිකර හණ මිටි අදහස් සහ ඒකාකෘති වැළැක්වීම සඳහා වන මාර්ගෝපදේශ;***

- සංක්‍රාන්තික සමාජභාවී පුද්ගලයන් ගැන ලියන විට, ඔවුන්ගේ ශරීරය සහ සංක්‍රාන්තික අවදියේ රැකවරණය සම්බන්ධ මාතෘකා කෙරෙහි අවධානය යොමු නොකිරීම[10].
- සමරිසි පුද්ගලයන්/ සංක්‍රාන්තික සමාජභාවී පුද්ගලයින්ගේ භෞතික පෙනුම පිළිබඳව වැඩි විස්තර වාර්තා නොකිරීම.
- LGBTQ පුද්ගලයන්ගේ දුක් කම්කටොළු වලින් ඔබ්බට ගොස්, ඔවුන් කම්පනයන් සහ ගැටළු පමණක් ඇති අවදානමට ලක්විය හැකි කණ්ඩායමක් ලෙස හුවා දැක්වීම වෙනුවට, ඔවුන් ගත කරන සාමාන්‍ය ජීවිතය සහ ඔවුන්ගේ සාර්ථක වෘත්තීය ජීවිතය පිළිබඳව වන කතා සෙවීම.
- සංක්‍රාන්තික සමාජභාවී පුද්ගලයන් පිළිබඳව වාර්තා කිරීමේදී, ඔවුන්ට බොහෝ විට අගෞරවයක් වන ලෙස,"ආදරණීය කෙනෙකු අහිමි වීම" යන හණ මිටි වාක්‍ය ඛණ්ඩ ප්‍රකාශ නොකිරීම.
- සංක්‍රාන්තික සමාජභාවී හෝ LGBTQ පුද්ගලයන් යම් ප්‍රවණතාවයක් ඉදිරියට ගෙන යන බව ඇඟවීමෙන් වැළකීම.
- "පෙර" සහ "පසු" පින්තූර භාවිතා කර ඒකාකෘතික වීමෙන් වැළකීම.

[10] මෙයට සමාජභාවී සංක්‍රාන්තිය හා සම්බන්ධ විවිධ සෞඛ්‍ය සේවා ඇතුළත් වේ. මෙයට හෝමෝන චිකිත්සාව සහ සමාජ භාවය තහවුරු කිරීමේ සැත්කම් සහ සංක්‍රාන්තික ක්‍රියාවලියේ දී පුද්ගලයෙකුට අවශ්‍ය වන අනෙකුත් සායනික රැකවරණ ඇතුළත් වේ. මෙය හුදෙක් රූපලාවන්‍යමය, පර්යේෂණාත්මක හෝ සරලව අනවශ්‍ය යැයි වැරදි වැටහීමක් ඇතත්, , පුද්ගලයෙකුගේ සමාජ භාවය,තමා පිරිමි හෝ ගැහැණු යයි හැඳින්වීමේ අභ්‍යන්තර හැඟීම ගැඹුරින් පිහිටා ඇති අතර එය වෙනස් කළ හැකි හෝ සුව කළ හැකි දෙයක් නොවේ. සංක්‍රාන්තික සමය ආශ්‍රිත රැකවරණ වෛද්‍යමය වශයෙන් අවශ්‍ය යැයි සැලකේ.

***සංක්‍රාන්තික සමාජභාවී විරෝධී වෛරය සහ වැරදි තොරතුරු ආවරණය කිරීම සඳහා වන මාර්ගෝපදේශ;***

- සංක්‍රාන්තික සමාජභාවී විරෝධී වෛරය ගැන ප්‍රවේශමෙන් වාර්තා කිරීම.
- වැරදි තොරතුරු පැතිරවීමෙන් වැළකීම, සෑම අවස්ථාවකදීම තොරතුරු නැවත පරීක්ෂා කිරීම.
- සංක්‍රාන්තික සමාජභාවී පුද්ගලයන් බැහැර කිරීමේ රැඩිකල් ස්ත්‍රීවාදීන්ට හෝ TERFs සඳහා වේදිකාවක් ලබාදීමෙන් වැළකීම[11]
- transmedicalists / truscum සඳහා වේදිකාවක් ලබා දීමෙන් වැළකීම (මෙය සංක්‍රාන්තික සමාජභාවී ප්‍රජාවේ කොටසක් වන අතර, තම සමාජභාවය පිළිබඳ තැවුලක් (gender dysphoria) අත්විඳීම සහ සමාජභාවය තහවුරු කරන වෛද්‍ය ප්‍රතිකාර ලබා ගැනීම සංක්‍රාන්තික සමාජභාවී වීමේ පූර්ව අවශ්‍යතාවයක් වන බව පිළිගනී)
- rapid onset gender dysphoria පිළිබඳ වැරදි තොරතුරු පැතිරවීමෙන් වැළකීම [12]
- සංක්‍රාන්තික තත්ත්වය නැවත හැරවීම පිළිබඳව [13] හෝ සංක්‍රාන්තික රැකවරණය නැවැත්වූ පුද්ගලයන් පිළිබඳ වැරදි තොරතුරු වාර්තා කිරීම හෝ ප්‍රකාශ කිරීමෙන් වැළකීම.
- ක්‍රීඩා කරන සංක්‍රාන්තික සමාජභාවී කාන්තාවන් ආවරණය කිරීමේදී වැරදි තොරතුරු පළ කිරීමෙන් වැළකීම.

***LGBTQ පුද්ගලයින් සමඟ සම්මුඛ සාකච්ඡා පැවැත්වීම සඳහා වන මාර්ගෝපදේශ***

- සංක්‍රාන්තික සමාජභාවී පුද්ගලයකු සම්මුඛ සාකච්ඡාවක් පැවැත්වීමේ දී, ඔවුන්ගේ සමාජභාවය උපකල්පනය නොකිරීම, සෑම විටම තමා ආමන්ත්‍රණය කළ යුතු ආකාරය ඔවුන්ගෙන් විමසීම.
- සංක්‍රාන්තික සමාජභාවී පුද්ගලයකු සම්මුඛ සාකච්ඡාවක් පැවැත්වීමේ දී, ඔවුන්ගේ ලිංගික දිශානතිය උපකල්පනය නොකිරීම, සෑම විටම තමා හඳුන්වා දිය යුතු ආකාරය ඔවුන්ගෙන් විමසීම
- සංක්‍රාන්තික සමාජභාවී පුද්ගලයකු සම්මුඛ සාකච්ඡාවක් පැවැත්වීමේ දී ඔවුන්ගේ සර්වනාම උපකල්පනය නොකිරීම, සෑම විටම තමා ආමන්ත්‍රණය කළ යුතු ආකාරය ඔවුන්ගෙන් විමසීම.
- ඔවුන්ගේ පැරණි නාමය භාවිතා කරමින් ඔවුන් හැඳින්වීමෙන් වැළකීම.
- ලිංගිකත්වය සහ ඔවුන්ගේ ලිංගික පුරුදු පිළිබඳ පුද්ගලික ප්‍රශ්න, එය ලිංගික සෞඛ්‍යයට සම්බන්ධ මාතෘකාවක් නම් මිස, ඇසීමෙන් වැළකීම.

---

[11] සංක්‍රාන්තික සමාජභාවී-විරෝධී අයිතිවාසිකම් කණ්ඩායමක් වන අතර පුද්ගලයන් ඔවුන්ගේ ද්වේෂ සහගත දෘෂ්ටිවාදය විස්තර කිරීමට "සමාජභාව විවේචනාත්මක ස්ත්‍රීවාදය" භාවිතා කරයි.

[12]. මෙය මානසික රෝග සහ සමාජ වසංගතයක ප්‍රතිඵලයක් ලෙස, සංක්‍රාන්තික සමාජභාවී පුද්ගලයන් "අනපේක්ෂිතව" පිටතට පැමිණියැයි කියන තරුණ තරුණියන් අතර පවතින වසංගත තත්ත්වයකි.

[13], Detransitioning " යනු සාමාන්‍යයෙන් සමාජ භාවය තහවුරු කරන වෛද්‍ය ප්‍රතිකාර ලබා ගැනීම සහ පසුව එය නැවැත්වීම සහ/හෝ එහි බලපෑම් ආපසු හැරවීමට උත්සාහ කිරීමයි.

# ශ්‍රී ලංකාවේ මාධ්‍ය විසින් කරනු ලබන වෙනස් කොට සැලකීමේ සහ අවමන් සහගත වාර්තාකරණය සහ වඩා හොඳ භාවිතයක් සඳහා වන යෝජනා.

ශ්‍රී ලංකාවේ මාධ්‍ය ආයතන විසින් LGBTQ පුද්ගලයන් හඳුන්වා දීමේදී හෝ විස්තර කිරීමේදී හෝ ඔවුන්ගේ ප්‍රශ්න වාර්තා කිරීමේදී, සමාජ අපහාසයන්, වෙනස් කොට සැලකීම්, වෛරය සහ ප්‍රචණ්ඩත්වය මතුවන ආකාරයෙන් සහ, ඔවුන්ගේ ලිංගික දිශානතිය, සමාජභාවී අනන්‍යතාවය හෝ ප්‍රකාශනය සම්බන්ධයෙන් ඔවුන්ට එරෙහිව ක්‍රියා කරන ආකාරයෙන් ඒවා වාර්තා කරනු ලබයි.

අසත්‍ය තොරතුරු (disinformation )[14], වැරදි තොරතුරු (misinformation)[15] මුල්බැසගත් සමාජ අපකීර්තීන්, වෛරයට සහ ප්‍රචණ්ඩත්වයට තුඩු දෙන LGBTQ ප්‍රජාව වටා ඇති විවිධ මිථ්‍යාවන් සහ වැරදි වැටහීම්, වෙනස් කොට සැලකීම්, වැනි ඍණාත්මක සමාජ සංජානනයන් බොහෝමයක්, පහත සඳහන්ව ඇති නමුත්, ඒවා එම ලැයිස්තුවට සීමා නොවේ;

- LGBTQ පුද්ගලයන් මානසික රෝගීන් වන බව.
- LGBTQ වීම සංස්කෘතියට සහ සමාජ සම්ප්‍රදායන්ට පටහැනි බව.
- LGBTQ පුද්ගලයින් රෝග පතුරවන බව (මෙය මහජන සෞඛ්‍ය ප්‍රතිකාරයකි)
- ඔවුන් ලිංගික උමතුවෙන් පෙලෙන්න වන බව.
- LGBTQ වීමේ ප්‍රවණතාවය හඹා යෑම පෞද්ගලික තේරීමක් වන බව
- ඔවුන් දරුවන්ට අනතුරුදායක වන බව
- LGBTQ වීම "නරක කර්ම විපාකයක්" වන බව
- LGBTQ පුද්ගලයකු වීම ලැජ්ජා සහගත කරුණක් වන බව

## මිථ්‍යාවන් සහ වැරදි වැටහීම්

LGBTQ පුවත් ආවරණය කරන බොහෝ ලේඛකයින් LGBTQ පිළිබඳ ඇතැම් වැරදි අහ අසත්‍ය තොරතුරු විශ්වාස කරන අතර, ඒවා බොහෝමයක් සමාජයේ මුල් බැස ගත් LGBTQ ප්‍රජාව වටා ඇති වැරදි වැටහීම්, මිථ්‍යාවන් සහ අපකීර්තීන් වල ප්‍රතිඵලයකි.

සුළුතරයේ ලිංගික දිශානතිය සහ සමාජභාවී අනන්‍යතාවය ජාතියේ බහුතර සංස්කෘතියට නොගැලපෙන බවත්, එය සමාජයට හානිකර වන බවත් මේවායින් සමහරකගේ ඇතුළත් වේ. බොහෝ විට මෙම චෝදනාවට රටේ පවතින ඇදහිලි වලින් එකක සහය ලැබෙන අතර, ශුද්ධ ලියවිලි ඒවාට පැහැදිලි සාක්ෂි ලෙස දක්වා ඇත. සමහර කතුවරුන් විසින් LGBTQ ප්‍රජාවට විරුද්ධ වීම, ඔවුන්ගේ පැවැත්ම, ජාතියේ මහා පුරවැසියන් ලෙස සැලකුම් ලැබීම, සහ "සත් පුරුෂ" හෝ " හොඳ" මිනිසුන් වීමට ඇති උවමනාව වෙනුවෙන් සිදු කරනා බව පෙනේ. LGBTQ පුද්ගලයන් ළමයින්ට අනතුරුදායකය යන වැරදි වැටහීම, පෙර කී වැරදි මතයෙන් පැන නගින්නේ අපගේ දරුවන්ට අයහපත් දේවලින් ආරක්ෂා කිරීම සමාජයේ වගකීමක් බව විශ්වාස කරන බැවිනි. මෙම වැරදි වැටහීම් සහ මිථ්‍යාවන් වලට උදාහරණ කිහිපයක් පහත සාකච්ඡා කෙරේ;

[14]Dis information යන්නෙන් අදහස් කරන්නේ මහජන මතයට බලපෑම් කිරීමට හෝ සත්‍ය වසන් කිරීමට හිතාමතාම සහ බොහෝ විට රහසිගතව පතුරුවා හරින අසත්‍ය තොරතුරුයිග

[15] misinformation යන්නෙන් අදහස් කරන්නේ මහජනතාව නොමඟ යැවීමේ නිශ්චිත චේතනාවකින් තොරව බෙදාගන්නා වැරදි හෝ නොමඟ යවන තොරතුරු යග

- *LGBTQ පුද්ගලයන් මානසික රෝගීන් වන බව:-*

***"ලිංගික දිශානතිය සහ ලිංගික අනන්‍යතාවය මත පදනම්ව පුද්ගලයන්ට දඬුවම් කිරීම වික්ටෝරියානු යුගයේ යටත් විජිත නීති පද්ධතිය මගින් ලොව පුරා ව්‍යාප්ත විය. නමුත් නූතන මනෝ වෛද්‍ය විද්‍යාව මෙය අපරාධයක් හෝ විකෘතියක් ලෙස නොසලකයි."'- (Daily news 25.08.2022)***

මෙය ශ්‍රී ලංකාවේ LGBTQ ප්‍රජාව නිර්සාපරාධීකරණය කිරීම සඳහා දණ්ඩ නීති සංග්‍රහයේ සංශෝධනයක් පිළිබඳව ජනාධිපතිවරයාට භාර දුන් තරමක් ප්‍රගතිශීලී ලිපියක් වන නමුත්, මෙම ඡේදයෙන් LGBTQ පුද්ගලයින් මානසික රෝගීන් බවට වන පොදු මිථ්‍යාව තවදුරටත් වර්ධනය කෙරේ. මෙය වැරදි තොරතුරු පතුරුවා හැරීමේ එක් උදාහරණයකි. වැරදි තොරතුරු යනු "නොමඟ යැවීමේ චේතනාවෙන් තොරව සිදු කරන මහජනතාව නොමඟ යැවිය හැකි ව්‍යාජ තොරතුරු" වේ. මෙයට සාවද්‍ය තොරතුරු මෙන් නොව, ජනතාව රැවටීමට හෝ නොමග යැවීමට පැහැදිලි චේතනාවක් නොමැති නමුත්, අසත්‍ය තොරතුරු පැතිරීමේ ප්‍රතිඵලයක් ලෙස එය සිදුවිය හැකිය. මෙයින් LGBTQ පුද්ගලයන් මානසික රෝගීන් යැයි වැරදි මතයක් පතුරුවන අතරම, මෙය විෂය පිළිබඳ පැහැදිලි දැනුමකින් තොරව බෙදාගත් තොරතුරක් බව පෙනේ.


යෝජිත නැවත ලිවිය යුතු ආකාරය: "වික්ටෝරියානු යුගයේදී, යටත් විජිත නීති පද්ධති මගින් පුද්ගලයන්ට ඔවුන්ගේ ලිංගික දිශානතිය සහ ලිංගික අනන්‍යතාවය මත පදනම්ව දඬුවම් කිරීම ලොව පුරා ක්‍රියාත්මක කිරීමට ඉඩ ලබා දී ඇත. ලිංගික දිශානතිය සහ ලිංගික අනන්‍යතාවය යනු පුද්ගලයෙකුගේ මනෝවිද්‍යාවට සම්බන්ධ කාරණා නොවන නිසා සමකාලීන මනෝ වෛද්‍ය විද්‍යාව තුළ මෙය අපරාධයක් හෝ විකෘතියක් ලෙස නොසැලකේ.."

***"යමෙකුට පිරිමියෙකු වීම සඳහා ශරීරයේ ටෙස්ටොස්ටෙරෝන් සැපයුම නොමැතිකම මොළයේ ලිංගික ඉගෙනීම වෙනස් වීමට හේතු වේ. එහි ප්‍රතිඵලයක් ලෙස පිරිමි වී උපන් අය සිතින් ගැහැණියක් බවට පත වෙයි" (වෙනුර සනත් කුමාර- දිවයින 15.12.2017)***

මෙය පාඨකයාට දැකීමට ප්‍රකාශයට පත් කර ඇති, සම්පූර්ණ සාවද්‍ය තොරතුරක් සහ විකෘති වූ විද්‍යාවේ අනුවාදයක් වන අතර, එමඟින් LGBTQ පුද්ගලයින් මානසික රෝගීන් බවට වන වැරදි වැටහීම තවදුරටත් වර්ධනය වේ.

යෝජිත නැවත ලිවිය යුතු ආකාරය: "පුද්ගලයෙකුගේ ලිංගික දිශානතිය, පුද්ගලයෙකුගේ ශාරීරික, රෝමාන්තික හෝ චිත්තවේගීය ආකර්ශනය පිළිබඳ වූ හැඟීම් විස්තර කරයි. ලිංගික දිශානතිය සඳහා උදාහරණ ලෙස විෂමරිසි, සමරිසි, ද්විරිසි, කුවියර, අලිංගික සහ වෙනත් දිශානති ඇතුළත් වේ.

- ***LGBTQ වීමේ ප්‍රවණතාවය හඹා යෑම පෞද්ගලික තේරීමක් වන බව***




මෙය සංක්‍රාන්තික සමාජභාවී පුද්ගලයින් වෙත යොමු වූ, ඔවුන් සම්ප්‍රදායිකව සතුටට පත් නොවන ආකාරයට ජීවිතය ගත කිරීමට තෝරා ගන්නා බවට වූ හැඟීමකින් පල වූ අදහසකි. එය සාමාන්‍යයෙන් කාන්තාවන්ට මෙන්ම ලිංගික සතුටටද තරමක් අපහාසාත්මක වූ ප්‍රකාශයක් වේ.

**"පළමුව, අපි මේ සියලු මිනිසුන්ට මිනිසුන් ලෙස ගරු කළ යුතු අතර පිළිගත යුතුය. ඔවුන්ගේ ලිංගික දිශානතිය ඔවුන්ගේ පෞද්ගලික තේරීමයි. ආසියානු මානසිකත්වය තුළ, LGBTQ ඡත්‍රය යටතේ සිටින අය විනිශ්චය කරනු ලන අතර ඔවුන් අපහාසයන්ට හා චිත්තවේගීය කම්පනයන්ට ලක් වේ." *(Dishan Joseph, Daily new 11.10.2021)***

නැවත වරක් මෙය මානසික සෞඛ්‍යයේ වැදගත්කම ප්‍රවර්ධනය කරන සහ මිනිසුන්ට සැලකිය යුතු ආකාරය පිළිඹිඹු කරන ප්‍රගතිශීලී ලිපිමකි. කෙසේ වෙතත්, 'ඔවුන්ගේ ලිංගික දිශානතිය ඔවුන්ගේ පුද්ගලික තේරීමයි' යන වාක්‍ය ඛණ්ඩයෙන් ඇඟවෙන්නේ, ලිංගික දිශානතිය මනාපයක් වන බවත්, ඒ අනුව එය වෙනස් කිරීමට හෝ සුව කිරීමට හැකි බවත් ය යන වැරදි තොරතුර ලේඛකයා විශ්වාස කරන බවයි. මෙය නැවතත් වැරදි තොරතුරු පැතිරීමක් වන අතර ලිංගික දිශානතිය ජීවන රටාව තුළ පවතින තෝරා ගැනීමක් බවට වැරදි මතයක් පතුරුවා හැරීමේ උදාහරණයකි.

යෝජිත නැවත ලිවිය යුතු ආකාරයː "පළමුව, ලිංගික දිශානතිය හෝ සමාජභාවය නොසලකා සියලුදෙනාම මිනිසුන් ලෙස, ඔවුන්ට ගරු කළ යුතු අතර ඔවුන්ව පිළිගත යුතුය. ආසියානු මානසිකත්වය තුළ, LGBTQ ඡත්‍රය යටතේ සිටින පුද්ගලයන් විවිධ විනිශ්චයන්ට, අපහාස සහ චිත්තවේගීය කම්පනයන්ට ලක් වේ.

- ***සංස්කෘතියට එරෙහිව:-***

**"ක්රෙම්ලිනයේ ප්‍රමිතීන් පවා සැලකිල්ලට නොගනිමින්, රුසියානු රාජ්‍ය රූපවාහිනිය, ටෝකියෝ ඔලිම්පික් උළෙලට තරග කරන, කළු සහ LGBTQ+ ක්‍රීඩකයන් ද්වේෂ සහගතව විවේචනය කරමින්, පිරිහුණු, අශිෂ්ට සහ "අපිරිසිදු" අසූචි වළක් ලෙස ඔලිම්පික් උළෙල විස්තර කරන ලදී.- (සන්ඩේ ඔබ්සර්වර් 2021.08.01)**


මෙය සංක්‍රාන්තික සමාජභාවී පුද්ගලයින්ව වෙනස් කොට සැලකීමට ලක් කල රුසියානු ප්‍රවෘත්ති සැසියක් පිළිබඳ ලිපියකි. මෙම ලිපියෙහි LGBTQ ප්‍රජාව පිළිබඳව වෙනස් කොට සැලකීමේ සහ අවමන් සහගත අදහස් කිහිපයක් ඇතුළත් වෙයි. මෙය හුදෙක් විකාශන ආයතනයක්, ඔවුන්ගේ වාර්තාකරණයක් හරහා සිදු කරන ලද වෙනස් කොට සැලකීමක් සම්බන්ධ වාර්තාවක් වුවද, සමස්තයක් ලෙස එවැනි වාර්තාකරණයන් මගින් සමාජයට සිදු විය හැකි හානිය පිළිබඳ විවරණයකින් තොරව මෙවැනි වාර්තාවක් පළ කිරීම ද "වෙනස් කොට සැලකීමක්" ලෙස හැඳින්විය හැකිය.

යෝජිත නැවත ලිවිය යුතු ආකාරය: "රුසියානු රාජ්‍ය රූපවාහිනිය ටෝකියෝ ඔලිම්පික් උළෙලට තරඟ වදින කළු සහ LGBTQ+ ක්‍රීඩකයන්ට එරෙහිව ද්වේෂ සහගතව සහ නිර්දය ලෙස ප්‍රහාරයක් එල්ල කරමින් පිරිහුණු, අශිෂ්ට සහ "අපිරිසිදු" අසූචි වළක් ලෙස ඔලිම්පික් උළෙල විස්තර කරන ලදී. මෙම වාක්‍ය ඛණ්ඩයෙන් පුද්ගලයෙකුගේ ලිංගික දිශානතිය මගින් අදහස් කරන්නේ කුමක්ද සහ සංක්‍රාන්තික සමාජභාවී යනු කුමක්ද යන්න පිළිබඳ පැහැදිලි නිර්වචනයක් ඇතුලත් වී ඇති අතර, මේ සම්බන්ධයෙන් වෛරී ප්‍රතිචාර පැතිරීම, වෙනස් කොට සලකන සහ අවමන් සහගත වන බව පෙන්වා දෙමින් ඒවා අධෛර්යමත් කළ යුතුය.
"විශේෂයන්ම මේ නීතිය ඉවත් කිරීමක් කලහොත් ඒ සඳහා දැඩි ආගමික විරෝධතාවක් ඇති බව පැවසූ රාජිත සේනාරත්න මහතා රටට නොගැලපෙන කිසිදු යෝජනාවකට වත්මන් රජය නො වන බව ද පැවසිය ." - පානුක රාජපක්ෂ, ලක්බිම,


LGBTQ ප්‍රජාවගේ පැවැත්ම පිළිගැනීම සහ ඔවුන්ගේ අයිතිවාසිකම් සුරැකීමට "ඉඩ දීම" ශ්‍රී ලාංකේය සංස්කෘතිය අනතුරේ හෙළන අතර ජාතියේ "අනාගත පරම්පරාවට" "තර්ජනාත්මක" වනු ඇතැයි යන ප්‍රමුඛ මතයකට මෙය උදාහරණයකි.





මෙය ශ්‍රී ලංකාවේ LGBTQ අයිතිවාසිකම් වල ප්‍රගතිය උදෙසා තම හඬ අවදි කල මියගිය දේශපාලනඥයෙකුට එල්ල කරන ලද , ද්වේෂ සහගත අදහසක් සඳහා වන උදාහරණයකි. 'පොන්නයා' යනු ශ්‍රී ලංකාවේ ප්‍රජාව වෙත එල්ල කරන පොදු සමරිසි භීතිකාව සම්බන්ධ වචනයකි.




මෙය සංස්කෘතික සම්මතයන්ට පටහැනි බව කියමින්, LGBTQ පුද්ගලයකුගේ ස්ත්‍රී හැසිරීම් පෙනෙන ටික්ටොක් වීඩියෝවක් සඳහා ඔහු වෙත යොමු කරන ලද වෛරී අදහස් මාලාවකි.




Nikah 2019 5 months ago
This should NOT be allowed in Sri Lanka. I strongly urge the Buddhist community led by the monks to come forward and stop events like these if they truly want to protect their religion. I repeat these things should be stopped at any cost.
15 Reply
24 replies
The one who killed John Wick's dog 4 months ago
Ok tribe 😅
6 Reply
oiii I have weak lungs 4 months ago
It's your religion not others let people live bruh 💀
9 Reply
The one who killed John Wick's dog 4 months ago
@oiii I have weak lungs Buddhism was never against homosexuality. That guy is talking BS.
14 Reply
oiii I have weak lungs 4 months ago
@The one who killed John Wick's dog tbh I'm not Shure but either waypeople should let people live there lives idc if your religion hates LGBT just respect people you know. Not that hard
2 Reply
The one who killed John Wick's dog 4 months ago
@oiii I have weak lungs I do respect every human being. And I do believe that they should live the way they love. I think you just misunderstood my comment.
6 Reply


Nikah 2019 5 months ago
This should NOT be allowed in Sri Lanka. I strongly urge the Buddhist community led by the monks to come forward and stop events like these if they truly want to protect their religion. I repeat these things should be stopped at any cost.
15 Reply
24 replies
The one who killed John Wick's dog 4 months ago
Ok tribe 😅
6 Reply
oiii I have weak lungs 4 months ago
It's your religion not others let people live bruh 💀
9 Reply
The one who killed John Wick's dog 4 months ago
@oiii I have weak lungs Buddhism was never against homosexuality. That guy is talking BS.
14 Reply
oiii I have weak lungs 4 months ago
@The one who killed John Wick's dog tbh I'm not Shure but either waypeople should let people live there lives idc if your religion hates LGBT just respect people you know. Not that hard
2 Reply
The one who killed John Wick's dog 4 months ago
@oiii I have weak lungs I do respect every human being. And I do believe that they should live the way they love. I think you just misunderstood my comment.
6 Reply

LGBTQ වීම ශ්‍රී ලාංකීය සංස්කෘතියට සහ බෞද්ධ ප්‍රතිපත්තිවලට පටහැනි බවත්, ඒවා දරුවන්ට අනතුරුදායක බවත් යන දුර්මතයන් තවදුරටත් වර්ධනය කරමින් වෛරී සහ වෙනස් කොට සැලකීමේ අදහස් මාලාවක් පළවුණ , කොළඹ ප්‍රයිඩ් සැමරුම් පිළිබඳ වීඩියෝවකි.

- *දරුවන්ට අනතුරුදායක වන බවː-*

**"වින්දනයන් ලබා ගැනීමට හෝ මුදල් සෙවීමට අඳුරු කාලයේ මහමගට හෝ පාළුතැන් වලට ඇදගෙන සමකාමීන් නිසා බාල පරම්පරාව ලිංගික කටයුතුවලට යොමුවන අවස්තා බහුල ය." (මිත්‍ර ශ්‍රී කරුණායක - ඉරිදා දිවයින 12.02.2017)**

ඉහත ප්‍රකාශය වෙනස් කොට සැලකීමක් වන අතර, LGBTQ ප්‍රජාව ලිංගික උමතුවෙන් පෙලෙන අය ලෙස හඳුන්වයි. එය මාධ්‍ය හරහා උසිගැන්වීම නොකළ යුතු, වැරදි සහ සම්පූර්ණයෙන්ම පිළිකුල් සහගත මතයක් වේ.


යෝජිත නැවත ලිවිය යුතු ආකාරයː "දෛනික මාර්ගවල නිතර මුණගැසෙන සහ දකින පුද්ගලයන්ගෙන් ඇති වන බලපෑම් ඇතුළු විවිධ හේතු නිසා බාල පරම්පරාව ලිංගික ක්‍රියාකාරකම්වලට සම්බන්ධ වීමට විශාල හැකියාවක් ඇත."

- *සමාජයට අනතුරුදායක වන බවː-*

**සිරස්තලය-**
**"තලංගම ව්‍යාපාරිකයා ඝාතනය කිරීම සම්බන්ධයෙන් සැකකරු පාපොච්චාරණය කරයි, සැකකරු සහ ඝාතනයට ලක්වූ දෙදෙනාම සමරිසි සමාජ ශාලාවක සිටි අයයි"- (දර්ශන සංජීව බාලසූරිය, ඩේලි මිරර් 06.02.2023)**

මෙය තලංගම ප්‍රදේශයේ සිදුවූ මනුෂ්‍ය ඝාතනයක යාවත්කාලීන කිරීම් විස්තර කෙරෙන ලිපියක සිරස්තලයකි. සිරස්තලයෙන් ඇඟවෙන්නේ මෙම ඝාතනය වින්දිතයාගේ ලිංගික දිශානතිය සහ ඔවුන් අතර තිබූ යැයි කියනු ලබන සම්බන්ධතාවයක ප්‍රතිඵලයක් විය හැකි අතර, එමගින් ඝාතනය සිදු කල මෙන්ම ඝාතනයට ලක් වූ වින්දිතයාගේ ලිංගික දිශානතිය පිළිබඳව ද උලුප්පා දක්වයි. මෙය මාධ්‍ය හරහා අසත්‍ය ප්‍රචාර පැතිරවීම පිළිබඳ තොරතුරකි. සාවද්‍ය තොරතුරු යනු මහජනතාව නොමඟ යැවීමේ අරමුණින් කෙරෙන අසත්‍ය තොරතුරු ලෙස හැඳින්වෙයි. ඉහත සඳහන් සිරස්තලයෙන් ඇඟවෙන්නේ ඝාතනයට සම්බන්ධ පුද්ගලයාගේ LGBTQ තත්ත්වය සමඟ ඝාතනය සිදු වූවක් බව පමණක් නොව, "සමරිසි සමාජය' යන වචනය භාවිතා කරමින් ඉහත කී සැකකරුගේ LGBTQ තත්ත්වය නිසා ඔවුන්ගේ අපරාධ වැරදි තහවුරු කළ යුතු බවට සමාජයට යෝජනා කිරීමට උත්සාහ කරයි.

යෝජිත නැවත ලිවිය යුතු ආකාරයː "තලංගම ව්‍යාපාරිකයා ඝාතනය කිරීම ගැන සැකකරු පාපොච්චාරණය කරයි"; මෙහි පාපොච්චාරණය පිළිබඳව දැක්වීමේදී, පුද්ගලයාගේ LGBTQ තත්ත්වය කතාවට අදාළ නොවන බැවින්, එය පිළිබඳ අප්‍රසාදය පළ කිරීම කිසිසේත්ම අවශ්‍ය නොවේ.




මෙය LGBTQ පුද්ගලයකු වෙත ද්වේශ සහගත ස්වරූපයෙන් සිදු කරන ලද අගෞරවනීය සහ අවමන් සහගත ප්‍රකාශයකි.

**"මොවුන් නිතරම වගේ පොදු වැසිකිළි ඇස්සේ ගැවසෙන අතර, පාසල් දරුවන්, වයස අවුරුදු *25* ට අඩු පිරිමි ළමයින් ඔවුන්ගේ ඉල්ලක්ක වෙති"**
**(ප්‍රගීත් සම්පත්-මව්බිම *08.10.(2017)*)**

මාධ්‍ය විසින් LGBTQ පුද්ගලයන්ව ළමා හිංසකයන් සහ ලිංගික උමතුවෙන් පෙළෙන්නන් ලෙස නම් කර ඒ අනුව, තම දරුවන් ආරක්ෂා කර ගත යුතු භයානක මිනිසුන් සමූහයක් ලෙස සඳහන් කර ඇත.

තවද යංග් අවුට් හියර් සංවිධානය විසින් *2017* වසරේ දී මාධ්‍ය වාර්තා සිදු වූ ආකාරය පිළිබඳව විශ්ලේෂණයක් සිදු කරන ලදී[16]. ඔවුන්ගේ සොයාගැනීම් තුළින්, එම වර්ෂය තුළ ප්‍රකාශයට පත් කරන ලද විවිධ වාර්තාවල ඉලක්කගත ප්‍රජාවන් පහත පරිදි බව පෙන්නුම් කරයි;

| Newspaper | Gay, Lesbian/ MSM | Transgender | Gay, Lesbian and Transgender | Total |
|---|---|---|---|---|
| Lakbima | 5 | 0 | 0 | 5 |
| Lankadeepa | 2 | 1 | 1 | 4 |
| Divaina | 11 | 4 | 4 | 19 |
| Mawbima | 6 | 4 | 0 | 10 |
| Dinamina | 5 | 1 | 1 | 7 |
| **Total** | **29** | **10** | **6** | **45** |

**ඉහත සඳහන් වැරදි තොරතුරු, අසත්‍ය තොරතුරු, මිථ්‍යාවන් සහ වැරදි වැටහීම් තවදුරටත් සිදු වීම වළක්වා ගන්නේ කෙසේද.**

ඉහත කොටසේ සපයා ඇති පරිදි LGBTQ පුද්ගලයන්ට අදාළ ගැටළු ගෞරවනීය ලෙස ඉතා ප්‍රවේශමෙන් වාර්තා කිරීම සඳහා වන මාර්ගෝපදේශ අනුගමනය කිරීමට අමතරව, LGBTQ පුද්ගලයන් පිළිබඳ වඩා හොඳ අවබෝධයක් සහ ඔවුන් මුහුණ දෙන නිශ්චිත සමාජ ආර්ථික ගැටලු, නිවැරදි වාර්තාකරණයට සහ ඉහත සඳහන් වැරදි තොරතුරු පැතිරීම වැළැක්වීමට ඉඩ සලසයි.

මාධ්‍ය ආයතන, සමාජ මාධ්‍යයේ බලපෑම් කළ හැකි පුද්ගලයන් , මාධ්‍යවේදීන් සහ සංස්කාරකවරුන් සඳහා වන ප්‍රධාන යෝජනාව වන්නේ LGBTQ පුද්ගලයන් පිළිබඳව, සංක්‍රාන්තික සමාජභාවී පුද්ගලයන්ගේ සංක්‍රාන්ති ක්‍රියාවලිය පිළිබඳව අවශ්‍ය පර්යේෂණ සිදු කිරීම සහ ඔවුන්ගේ ලිපි සහ අනෙකුත් ප්‍රතිදානයන් නවතම නිවැරදි තොරතුරු සමඟ පෙළ ගැසෙන බව සහතික කිරීමයි.

Trans Journalists Association සහ GLADD මාධ්‍ය යොමු මාර්ගෝපදේශයේ 11 වන සංස්කරණයට අනුව[17], LGBTQ පුද්ගලයින් පිළිබඳ සඳහන් කිරීමේ දී සහ ඔවුන් සම්බන්ධ ගැටළු වාර්තා කිරීමේ දී මඟ හැරිය යුතු වචන මාලාවක් පහත සඳහන් පරිදි වේ;

[16] වැරදි ලෙස භාවිතා කරන ලද වචන, පුවත්පත් වාර්තාකරණය හරහා LGBTQ ප්‍රජාව වෙත එල්ල කරන ලද අපකීර්තීන්, වෙනස් කොට සැලකීම් සහ ප්‍රචණ්ඩත්වය පිළිබඳ අධ්‍යයනයක්
[17] https://www.glaad.org/reference/terms

## වළක්වා ගත යුතු වචන සහ වාක්‍ය ඛණ්ඩ

1. සායනික වන බැවින් සහ LGBTQ විරෝධී කණ්ඩායම් විසින් ආක්‍රමණශීලී ලෙස භාවිතා කරන බැවින් 'සමලිංගිකයා' යන යෙදුම භාවිතා කිරීමෙන් වැළකීම. ඒ වෙනුවට සමරිසි පුද්ගලයා/පුද්ගලයින් යන වචන භාවිතා කිරීම.
2. 'සමලිංගික යුවල' (අනවශ්‍ය සහ අප්‍රසන්න වේ) යන යෙදුම භාවිතා කිරීමෙන් වැළකීම, ඒ වෙනුවට "යුවල" භාවිතා කරන්න.
3. "ජීව විද්‍යාත්මක සමාජභාවය," "ජීව විද්‍යාත්මක ලිංගිකත්වය," "ජීව විද්‍යාත්මක කාන්තාව," "ජීව විද්‍යාත්මක ස්ත්‍රිය," "ජීව විද්‍යාත්මක පුරුෂයා" හෝ "ජීව විද්‍යාත්මක පුරුෂයා" යන යෙදුම් භාවිතා කිරීමෙන් වැළකීම. ඒ වෙනුවට උපතේදී පිරිමි/ගැහැණුන් ලෙස පවරා ඇති, උපතේදී පවරන ලද ලිංගිකත්වය හෝ පිරිමි ළමයෙකු/ගැහැණු ළමයෙක් ලෙස හැදී වැඩීම යන යෙදුම් භාවිතා කිරීම.
4. 'විරුද්ධ ලිංගික ඇඳුම් අඳින පුද්ගලයා' යන යෙදුම භාවිතා කිරීමෙන් වැළකීම (එය සංක්‍රාන්තික සමාජභාවී පුද්ගලයින්ට අහිතකර වන, යල් පැන ගිය යෙදුමක් වේ.)
5. ස්ත්‍රී සර්වනාම, පුරුෂ සර්වනාම' ලෙස ප්‍රකාශ කිරීමෙන් වැළකීම (she/her ලෙස සර්වනාමය භාවිතා කරන සියල්ලන්ම කාන්තාවන් නොවන බවත්, he/him ලෙස සර්වනාමය භාවිතා කරන සියල්ලන්ම පිරිමින් නොවන බවත් සැලකිය යුතුය). ඒ වෙනුවට, 'she/her සර්වනාම, he/him සර්වනාම' භාවිතා කිරීම.
6. සමාජභාවී අනන්‍යතාවය පිළිබඳ රෝගී තත්ත්වය (gender identity disorder) (එය යල් පැන ගිය සහ අහිතකර වේ) යන වාක්‍ය ඛණ්ඩය භාවිතා කිරීමෙන් වැළකීම. ඒ වෙනුවට, ' gender dysphoria' භාවිතා කිරීම.
7. සමාජභාවය ද්විමය නොවන ලෙස භාවිතා කිරීමෙන් වැළකීම, (ව්‍යාකරණමය වශයෙන් වැරදි ලෙස සලකනු ලැබේ), ඒ වෙනුවට ද්විමය නොවන ලෙස භාවිතා කිරීම
8. සංක්‍රාන්තික 'සමාජභාවී පුද්ගලයකු හඳුන්වනු ලබන්නේ' යන වාක්‍ය ඛණ්ඩය භාවිතා කිරීමෙන් වැළකීම (මෙය සංක්‍රාන්තික සමාජභාවී පුද්ගලයාගේ සමාජභාවය අනන්‍යතාවයක් ලෙස හඳුන්වමින් ප්‍රශ්න කරයි), ඒ වෙනුවට, is භාවිතා කරන්න.
9. 'පිරිමි-ශරීර/ගැහැණු-ශරීර' (වැරදි සහ අප්‍රසන්න වේ) යන වාක්‍ය ඛණ්ඩ භාවිතා කිරීමෙන් වැළකීම, ඒ වෙනුවට, 'උපතේදී පිරිමි/ගැහැණුන්ට පවරා ඇති හෝ පිරිමි ළමයෙකු/ගැහැණු දරුවෙකු ලෙස හැදී වැඩුණු' යන්න භාවිතා කිරීම.
10. 'පිරිමි-ගැහැණු (MtF), ගැහැණු-පිරිමි (FtM)' යන යෙදුම් භාවිතා කිරීමෙන් වැළකීම, ඒ වෙනුවට, සමාජභාවී කාන්තාව, සස්ක්‍රාන්තික සමාජභාවී පුරුෂ, යන යෙදුම් භාවිතා කිරීම.
11. 'ද්විමය නොවන සර්වනාම' යන යෙදුම භාවිතා කිරීමෙන් වැළකීම (මෙය වැරදිය, සියලුම ද්විමය නොවන පුද්ගලයින් එකම සර්වනාම භාවිතා නොකරයි), ඒ වෙනුවට, සමාජභාවය ප්‍රකාශ නොවන සර්වනාම, (they/them) සර්වනාම, හෝ සර්වනාම' භාවිතා කිරීම.

12. 'විරුද්ධ ලිංගික/ලිංගභේදය' යන යෙදුම භාවිතයෙන් වැළකීම (මෙම පදය වැරදි ලෙස පිරිමි සහ ගැහැණු යන ප්‍රතිවිරුද්ධයන් ස්ථානගත කරයි), ඒ වෙනුවට 'විවිධ සමාජ භාවයයන්/ලිංගිකත්වය' යන්න භාවිතා කිරීම.
13. 'වඩාත් කැමති සර්වනාම' යන යෙදුම භාවිතයෙන් වැළකීම (පුද්ගලයෙකුගේ සර්වනාම යනු, ඒවා හැඳින්වීමට සුදුසු ක්‍රමයට වඩා මනාපයක් ය), ඒ වෙනුවට සර්වනාම යන යෙදුම භාවිතා කිරීම.
14. ලිංගිකත්වය වෙනස් කිරීම/ලිංගිකත්වය නැවත පැවරීම (යල් පැන ගිය සහ ආක්‍රමණශීලී වේ), ඒ වෙනුවට, සංක්‍රාන්තිය, සමාජභාවය තහවුරු කරන රැකවරණය, හෝ සංක්‍රාන්තිය ආශ්‍රිත රැකවරණය' යන යෙදුම් භාවිතා කිරීම.
15. සංක්‍රාන්තික සමාජභාවී ලෙස පොදුවේ හඳුනා නොගත් කෙනෙකු නිර්වචනය කිරීම සඳහා රහසිගත/සම්මත වූ යන පද භාවිතා කිරීමෙන් වැළකීම, ඒ වෙනුවට, 'සංක්‍රාන්තික සමාජභාවී ලෙස පිටතට පැමිණි, 'සංක්‍රාන්තික සමාජභාවී ලෙස පිටතට නොපැමිණි' යන වාක්‍ය භාවිතා කිරීම.
16. Transgenderism / ලිංගික දෘෂ්ටිවාදය / සංක්‍රාන්තික දෘෂ්ටිවාදය / සංක්‍රාන්තික න්‍යාය පත්‍රය' යන යෙදුම් භාවිතා කිරීමෙන් වැළකීම (මෙය 'සංක්‍රාන්තික සමාජභාවී විරෝධී ව්‍යාපාර මගින් වැරදි තොරතුරු ලෙස භාවිතා කළ හැක). ඒ වෙනුවට, 'සංක්‍රාන්තික සමාජභාවී'යන්න භාවිතා කිරීම.
17. LGBTQ ජීවන රටාව, සමරිසි ජීවන රටාව (මෙය වැරදි, වෙනස් කොට සැලකීමේ ආකාරයක් වන අතර LGBTQ වීම තේරීමක් බව අඟවයි) යන යෙදුම් භාවිතයෙන් වැළකීම. ඒ වෙනුවට, LGBTQ පුද්ගලයින් සහ ඔවුන්ගේ ජීවිත යන්න යොදාගැනීම.
18. පොන්නයා, සමලිංගිකයා, සොදොමියා යනුවෙන්, වෙනස් කොට සැලකීමේ සහ පහත් කොට සැලකීමේ යෙදුම් භාවිතා කිරීමෙන් වැළකීම.
19. LGBTQ ප්‍රජාවේ සාමාජිකයන් "විපරීත", "අක්‍රමිකතා සහිත", "අක්‍රිය වූ", "අසනීප", "විකෘති වූ", " විනාශකාරී වූ" ලෙස විස්තර කිරීමෙන් වැළකීම.
20. LGBTQ පුද්ගලයන් ළමා අපචාරයන්, ලිංගික අපයෝජනයන්, ව්‍යාභිචාරය, බහු විවාහයන්, සහ/හෝ අනාචාරයන් සිදුකරන බව සඳහන් කිරීමෙන් වැළකීම.

# නිතර මතුවන ප්‍රශ්න සඳහා පිළිතුරු

**LGBTQ විරෝධී ප්‍රචණ්ඩත්වය වාර්තා කරන්නේ කෙසේද?**
මූලාශ්‍ර බොහෝමයක් භාවිතා කරමින් කරුණු තහවුරු කිරීමෙන් තොරව, කිසිවක් වාර්තා කිරීම හෝ ප්‍රචාරය කිරීමෙන් වැළකිය යුතුය. LGBTQ පුද්ගලයන්ට එරෙහිව සිදු වූ අපරාධ පිළිබඳව වාර්තා කිරීමේදී, ඉක්මනින් විනිශ්චයන්ට එළඹීමෙන් වැළකිය යුතුය. පිළිගත හැකි දාම ඝාතකයෙකුට එවැනි මිනීමැරුම් මාලාවකට චෝදනා කිරීමෙන් වැලකිය යුතු අතර, LGBTQ පුද්ගලයෙකුගේ මරණය මිනීමැරුමක් බවට නිගමනය කිරීමෙන් වැලකිය යුතුය.

**සංක්‍රාන්තික සමාජභාවී LGBTQ පුද්ගලයන්ට එරෙහි ප්‍රචණ්ඩත්වයන් වාර්තා කිරීමේදී භාවිතා කළ යුතු මූලාශ්‍ර මොනවාද?**
මාධ්‍යවේදීන් LGBTQ පුද්ගලයන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය පිළිබඳව වාර්තා කිරීමේදී පොලීසියට අමතරව වෙනත් ආකාරයකින් තොරතුරු සෙවිය යුතුය. සාමාන්‍යයෙන් සංක්‍රාන්තික සමාජභාවී ලෙස හඳුනා ගන්නා වින්දිතයන්ව පොලිසිය වැරදි ලෙස හඳුනා ගන්නා අතර, වැරදි සමාජභාවය භාවිතා කර පැරණි නම භාවිතා කරයි. බොහෝ විට අසත්‍ය වන මෙම තොරතුරු ප්‍රකාශයට පත් කළහොත් LGBTQ සංවිධාන සමඟ මාධ්‍ය වලට තිබෙන සබඳතාවලට හානි සිදු විය හැකිය.

**ඝාතනයට ලක් වූ LGBTQ පුද්ගලයන් ගැන වාර්තා කිරීමේදී මතක තබා ගත යුතු විශේෂ සටහන් මොනවාද?**
මෑතක දී මිය ගිය LGBTQ පුද්ගලයන් ගැන වාර්තා කිරීමේ දී, සමාජභාවය, ලිංගික දිශානතිය සහ ඔවුන්ට එරෙහිව කරන ලද අපරාධ දක්වා ඔවුන්ගේ ජීවිතය පහතට හෙලන බව සැලකිය යුතුය. වින්දිතයාගේ ජීවිතය සංවේදී කිරීම වෙනුවට, මෙම කථා ඔවුන් වඩාත් සියුම් ආකාරයෙන් නිරූපණය කිරීමට උත්සාහ කළ යුතුය.

**පුද්ගලයකු LGBTQ ප්‍රජාවේ සාමාජිකයෙකු ලෙස පෙනෙන නමුත්, ඒ බව අවිනිශ්චිත නම් කුමක් කළ යුතුද?**
සංක්‍රාන්තික සමාජභාවී පුද්ගලයන් හෝ වෙනත් සමාජවල පවතින සමාජභාවී විවිධත්වයන් පිළිබඳ සාමාන්‍යකරණයන් නොකිරීම. ඔබගේ සංස්කෘතිය හැර වෙනත් සංස්කෘතියක් ගැන වාර්තා කිරීමේදී, එම සංස්කෘතික සන්දර්භය තුළ පුද්ගලයින් සහ පුද්ගල කණ්ඩායම් නිවැරදිව අවබෝධ කර ගැනීම සහ නිවැරදිව නිරූපණය කිරීම සඳහා අමතර සැලකිල්ලක් දැක්වීම වැදගත් වේ.

**LGBTQ ලිංගික වෘත්තිකයන් පිළිබඳ වාර්තා කිරීම සඳහා හොඳම භාවිතයන් මොනවාද?**
ඔබ ලියන සංක්‍රාන්තික සමාජභාවී පුද්ගලයන්ගෙන්, ඔවුන්ගේ රැකියාව සඳහන් කරන අවස්ථාවලදී ඔවුන් හඳුන්වා දීම සඳහා ඔබ භාවිතා කළ යුතු නම් සහ සර්වනාම මොනවාදැයි විමසිය යුතුය.

**මූලාශ්‍රයන් විසින් ඔබට ඉතා විශ්වාසයෙන් කතාවක් පවසා, එය මාධ්‍යවල බෙදා හැරීම ප්‍රතික්ෂේප කළ විට කුමක් සිදුවේද?**
කුමන තොරතුරු පොදු විය යුතුද සහ පුද්ගලික විය යුතුද යන්න තීරණය කිරීම සඳහා, මූලාශ්‍රයන් සමඟ කතා කර ස්ථිර කර ගත යුතුය. නිදසුනක් වශයෙන්, සමහර මූලාශ්‍ර ඔවුන්ගේ සගයන්ගේ ලිංගික හැසිරීම් ගැන දැන සිටිය හැකි නමුත්, ඔවුන්ගේ ආරක්ෂාවට එය අනතුරක් වේ යැයි බියෙන් එය ප්‍රසිද්ධ කිරීමට අකමැති වන අවස්ථාද ඇත. ඇතැම් වෙබ් අඩවි ඔවුන්ගේ සමහර සේවාවන් විවෘතව ප්‍රචාරණය කරන නමුත්, ඔවුන්ගේ සම්පූර්ණ සේවා කර්තව්‍යයන් ගැන අහඹු ලෙස පමණක් සාකච්ඡා කරයි.

# LGBTQ ප්‍රජාව වැනි ආන්තිකරණයට ලක් වූ ප්‍රජාවන්ට එරෙහිව සිදු වන වෙනස්කොට සැලකීමේ පදනමේ වගකීම.

LGBTQ පුද්ගලයන්ට අදාළ ගැටළු වාර්තා කිරීමේදී සහ ප්‍රකාශ කිරීමේදී, මාධ්‍ය ආයතන, මාධ්‍යවේදීන් සහ සමාජ මාධ්‍ය බලපෑම් කරන්නන් විසින් හිරිහැර කිරීම්, අපයෝජනයන් සහ වෙනස් කොට සැලකීම්, සිදු නොකිරීමට වග බලා ගැනීම සඳහා යම් නීති සහ රෙගුලාසි ක්‍රියාත්මක වේ.

## 1973 අංක 5 දරණ ශ්‍රී ලංකා පුවත්පත් මණ්ඩල පනත

1973 අංක 5 දරණ ශ්‍රී ලංකා පුවත්පත් මණ්ඩල පනත ස්ථාපිත කරන ලද්දේ මාධ්‍ය ක්ෂේත්‍රය තුළ ප්‍රචණ්ඩත්වය සහ හිරිහැර කිරීම් සිදු නොවීමට වග බලා ගැනීම සඳහා ය. [18] ඉහත සඳහන් කළ පනතේ 8 වැනි වගන්තියට අනුව, මෙම පනතේ අරමුණු වන්නේ ශ්‍රී ලංකාවේ මාධ්‍ය නිදහස සහතික කිරීම, එම නිදහස අනිසි ලෙස භාවිත කිරීම වැළැක්වීම සහ හොඳම වෘත්තීය ප්‍රමිතීන්ට අනුකූලව ශ්‍රී ලංකාවේ පුවත්පත්වල අඛණ්ඩතාව ආරක්ෂා කිරීම වේ.

ඉහත සඳහන් පනතේ 26 වැනි වගන්තියට අනුව, සෑම මුද්‍රිත පුවත්පතකම පිටපතක් මෙන්ම එම පුවත්පතේ පසුකාලීනව වෙනස් කරන ලද සෑම සංස්කරණයක්ම හෝ ප්‍රකාශයක්ම, මුද්‍රණය කළ හෝ ප්‍රකාශයට පත් කළ විට, අවශ්‍ය පරිදි එම පුවත්පතේ මුද්‍රණකරුගේ හෝ ප්‍රකාශකයාගේ අත්සන සහ ලිඛිත සටහනක් සමඟ කොමසාරිස් කාර්යාලයට භාර දිය යුතුය.

පනතේ 30 වැනි වගන්තියේ සඳහන් වන ආකාරයට, කවුන්සිලයට මුද්‍රණකරුවන් සහ ප්‍රකාශකයන් සඳහා වන නීති රීති සම්පාදනය කළ හැකි අතර, මාධ්‍යවේදීන් සඳහා වන ආචාර ධර්ම සංග්‍රහය ගෙනහැර දැක්විය හැකි වේ. පනතේ 32 වැනි වගන්තියට අනුව, කවුන්සිලයේ කිසියම් නීත්‍යානුකූල නියෝගයකට අකීකරු වන හෝ වෙනත් ආකාරයකින් මෙම නීතියේ යම් විධිවිධාන උල්ලංඝණය කරන ඕනෑම අයෙකු, මහේස්ත්‍රාත්වරයකු ඉදිරියේ ලඝු නඩු විභාගයකින් පසුව මෙම නීතිය යටතේ වරදකරු වන අතර, රුපියල් දහසක දඩයකට යටත් වේ.

## 2003 අංක 36 දරණ බුද්ධිමය දේපල පනත

බුද්ධිමය දේපළ පනතේ II වන කොටසෙහි මාධ්‍ය ආයතන විසින් ප්‍රකාශන හිමිකම් නීති උල්ලංඝණය කිරීම සඳහා විධිවිධාන සලසා ඇත. පනතේ 6 වන වගන්තිය පොත්, ලිපි, වෙනත් ලේඛන, දේශන, සංගීත කෘති, නර්තන නිර්මාණ, ශ්‍රව්‍ය දෘෂ්‍ය කෘති, චිත්‍ර ඇඳීම්, පින්තාරු කිරීම, නිදර්ශන, සිතියම්, සැලසුම් සහ රූප සටහන්, කලාත්මක සහ විද්‍යාත්මක අංශය තුළ ඇති බුද්ධිමය නිර්මාණ විශේෂයෙන් හඳුනා ගනී.

22 වන වගන්තියට අනුව, බුද්ධිමය දේපල හිමි පුද්ගලයාගේ සැබෑ නම සහ මුල් නිර්මාණය ප්‍රකාශ කිරීමට මාධ්‍ය ආයතනවලට හැකිය. ඒ අතරම, 170 වන වගන්තියේ ප්‍රකාශන හිමිකම් උල්ලංඝණය කිරීමේ අවස්ථාවකදී, නීති විරෝධී පිටපත් අත්අඩංගුවට ගෙන විනාශ කිරීම සඳහා වාරණ නියෝග ලබා දීමට සහ අලාභ ලබාදීමට අධිකරණයට බලය ඇත.

[18] http://www.commonlii.org/lk/legis/num_act/slpcl5o1973298/s8.html

148 වැනි වගන්තිය යටතේ උල්ලංඝණය වීම්, සාපරාධී වරදක් වන අතර, මහේස්ත්‍රාත්වරයා ඉදිරියේ නඩු විභාගයකින් පසුව, වරදකරු කිරීමෙන් රුපියල් ලක්ෂ පහකට නොවැඩි දඩයකට හෝ මාස හයකට නොවැඩි කාලයක් සඳහා සිරගත කිරීමකට හෝ දෙයාකාරයටම යටත් විය යුතුය.

## අපහාස නීතින් සහ වගකීම්

යමෙකු හිතාමතාම වෙනත් කෙනෙකුගේ ප්‍රතිරූපයට හානි කිරීමට අසත්‍ය තොරතුරු ප්‍රචාරය කරන විට එය අපහාසයක් ලෙස ද හැඳින්වේ. එහි කොටස් දෙකක් තිබේ. එනම්, අපවාද කිරීම (Libel) සහ නින්දා කිරීම (slander) වේ. අපවාද යනු ස්ථාවර මාධ්‍යයකින් ප්‍රකාශ කරනු ලැබූ  අපහාසාත්මක ප්‍රකාශයකි (සාමාන්‍යයෙන් එය ලිඛිතව පවතින නමුත් පින්තූරයක්, ලකුණක් හෝ ගුවන් විදුලි හෝ රූපවාහිනී විකාශනයක් ද විය හැකිය). නින්දා යනු වාචිකව සිදු කරන ලද අපහාසාත්මක ප්‍රකාශයන් ය.

අපහාසයක් "අලාභ හානි සිදුකිරීමේ වරද" (tort) යන ගණයට අයත් වන අතර, එම නීති ලිඛිත නොවේ, ඒවා හුදෙක් පූර්වාදර්ශයන් මත ඉදිරිපත් කෙරේ. පුද්ගලයෙකුගේ යම් හැසිරීමක් අසාධාරණ ලෙස වෙනත් පුද්ගලයෙකුට පාඩුවක් හෝ හානියක් අත්විඳීමට හේතු වේ නම්, එම පුද්ගලයාට ඔවුන්ගේ ක්‍රියාව සඳහා "නීතිමය වගවීමක්" ඇති බව පැවසිය හැකිය.

හිටපු ආරක්ෂක ලේකම් ගෝඨාභය රාජපක්ෂ මහතා සම්බන්ධව, 2010 දී සන්ඩේ ලීඩර් පුවත්පතට විරුද්ධව රු. බිලියන 2ක නඩුවක් දැමීම, මෑතකදී සිදු වූ ඉතා ප්‍රසිද්ධ අපහාස නඩුවක් වෙයි. අපහාසයට නඩු පවරන පුද්ගලයා මුලින්ම අසත්‍ය සහ අපහාසාත්මක ප්‍රකාශයේ මාතෘකාව විය යුතුය. මෙම අදහස් වාචිකව, ලිඛිතව හෝ චිත්‍රක ආකාරයෙන් පවා සිදු කළ හැකිය. පුවත්පත් සිරස්තලයක් වුවද අපකීර්තියට පත්වන සේ සැලකිය හැකි බැවින් සම්පූර්ණ ප්‍රකාශයම එසේ වීමට අවශ්‍ය නොවේ.

තාක්‍ෂණිකව ගත් කල, ෆේස්බුක් තුළ අපහාසාත්මක "ස්ටේටස්"  හෝ අදහසක් හෝ බෙදා හැරිය විටකදී, එය ශ්‍රී ලංකාව තුළ නොකල අවස්ථාවක දී වුවද ඊට විරුද්ධව නඩු මාර්ගයට යොමු විය හැක. මෙයට හේතුව වන්නේ, මෙම අපහාසාත්මක අන්තර්ගතයන් දහස් ගණනකට "පළ කිරීමේ" බලපෑමක් ඇති බැවිනි. කෙසේ වෙතත්, අසත්‍ය බව නොදැන යමෙකු අපහාසාත්මක අන්තර්ගතයන් එය "බෙදා ගන්නේ" නම්, නීතිය යටතේ ඔවුන් වග නොකියනු ඇත.

යම් පුද්ගලයෙකු අපහාසයට වගකිව යුතු අවස්ථාවක, නඩුවේ තත්වයන් මත පදනම්ව, සිදු වූ හානියට අලාභ ගෙවීමට බැඳී සිටී.

## 2007 අංක 24 දරණ පරිගණක අපරාධ පනත

මෙම පනතේ 3 වන වගන්තියඃ යම්කිසි තැනැත්තකු විසින් හිතාමතාම තමා උදෙසා හෝ වෙනත් යම් තැනැත්තකු උදෙසා (අ) යම් පරිගණකයකට හෝ (ආ) යම් පරිසණකයක් තුළ ගබඩා කර තිබෙන තොරතුරු...රුපියල් එක් ලක්ෂයකට නොවැඩි දඩයකට හෝ අවුරුදු පහක් දක්වා දීර්ඝ විය හැකි දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීම සහ එම දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දෙකටම යටත් විය යුතුය.

10 වැනි වගන්තියඃ පරිගණකයක් මාර්ගයෙන් සපයනු ලබන යම් සේවාවකට ප්‍රවේශ වීමට හැකි කරවමින් තමාට පවරා දෙනු ලැබූ තොරතුරු, යම් ප්‍රකාශිත අධිකාරී බලයක් නොමැතිව හෝ යම් ප්‍රකාශිත හෝ ව්‍යංජිත ගිවිසුමක් කඩකරමින් හෝ අනාවරණය කරන්නා වූ යම් තැනැත්තකු වරදකට වරදකරු විය යුතු අතර, වරදකරු කරනු ලැබූ විට රුපියල් ලක්ෂයකට නොඅඩු සහ රුපියල් ලක්ශ තුනකට නොවැඩි දඩයකට හෝ මාස හයකට නොඅඩු සහ අවුරුදු තුනකට නොවැඩි කාලයක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකට නැතහොත් ඒ දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකටම හෝ යටත් විය යුතුය.

## මූලික අයිතිවාසිකම් උල්ලංඝණය කිරීම

LGBTQ පුද්ගලයන්ට එරෙහිව ඇති නැඹුරුතාව සහ පක්ෂපාතකම වාර්තා කිරීම, වෙනස් කොට සැලකීමක් සහ අමානුෂික වේ. ජාතික මාධ්‍ය සංවිධානයක් ඉහත කී අපරාධය සිදු කරන්නේ නම්, ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12 වැනි ව්‍යවස්ථාවට අනුව, ඔවුන්ගේ ජාතිය, සමාජ භාවය, ලිංගික දිශානතිය හෝ වෙනත් සාධක මත වෙනස් කොට සැලකීම යන පුද්ගලයෙකුගේ මූලික අයිතිවාසිකම් උල්ලංඝණය කිරීමක් වේ.

12 වැනි ව්‍යවස්ථාව මගින් "නීතිය පසඳලීම සහ ක්‍රියාත්මක කිරීම ද, නීතියේ රැකවරණය ද සර්ව සාධාරණ විය යුත්තේ ය. කිසිම පුරවැසියකු වර්ගය, ආගම, භාෂාව, කුලය, ස්ත්‍රී පුරුෂ භාවය, දේශපාලන මතය,උපන් ස්ථානය හෝ ඉන් කවර වූ හේතුවක් මත හෝ වෙනස්කමාට හෝ විශේෂයකට හෝ භාජනය නොවිය යුත්තේ ය."

මූලික අයිතිවාසිකම් යනු රාජ්‍යය සහ ජාතික මාධ්‍ය සංවිධාන ඇතුළු සියලුම රාජ්‍ය ආයතන තම රටේ පුරවැසියන් ආරක්ෂා කරන බවට දිවුරුම් දෙන ලද මානව හිමිකම් වන අතර, එවැනි උල්ලංඝණය කිරීමකට ගොදුරු වූවන්ට මානව හිමිකම් කොමිෂන් සභාවට හෝ ශ්‍රී ලංකාවේ ශ්‍රේෂ්ඨාධිකරණයට මූලික අයිතිවාසිකම් පෙත්සමක් ගොනු කළ හැකිය.

# වැඩිදුර කියවීම සඳහා:

- මම සංක්‍රාන්තික සමාජභාවී පුද්ගලයකු විය හැකිය- https://www.equal-ground.org/wp-content/uploads/I-MIGHT-BE-TRANSGENDER.pdf

- මම සමරිසි පුරුෂයකු විය හැකිය https://www.equal-ground.org/wp-content/uploads/Gay-English.pdf

- **මම සමරිසි** ගැහැණියක් විය හැකිය https://www.equal-ground.org/wp-content/uploads/Lesbian-English-.pdf

- මම ද්විරිසි පුද්ගලයකු විය හැකිය https://www.equal-ground.org/wp-content/uploads/Bi-English-.pdf

- ශ්‍රී ලංකාවේ LGBT අපකීර්තිතිය පිළිබඳව දර්ශකය (LGBT Stigma Index) https://www.equal-ground.org/wp-content/uploads/The-LGBT-Stigma-and-Discrimination-Index-of-Sri-Lanka-A-project-of-EQUAL-GROUND.pdf

- සමරිසි ප්‍රචණ්ඩත්වයට සහ සාපරාධී අපරාධවලට එරෙහිව අරගල කිරීම https://www.equal-ground.org/wp-content/uploads/homophobicviolencebooklet.pdf

- LGBTQ පාරිභාෂිතය අවබෝධ කර ගැනීම https://www.equal-ground.org/wp-content/uploads/LGBTIQ-Terminology-EN-1.pdf

BRIDGE to EQUALITY
සමානාත්මතාවය සොයා...
சமத்துவத்தை தேடுதல்...

BRIDGE to Equality යනු ශ්‍රී ලංකාවේ LGBTQ ප්‍රජාවන්ගේ මානව හිමිකම් සුරැකීම වෙනුවෙන් ක්‍රියාත්මක වන ව්‍යාපෘතියකි. ජාත්‍යන්තර මානව හිමිකම් සහ නීති පිලිබඳව විනිසුරුවරුන්, නීතීඥයින් සහ අනෙකුත් මානව හිමිකම් ක්‍රියාකාරීන් දැනුවත් කිරීම තුළින් ශ්‍රී ලංකාවේ LGBTQ පුද්ගලයින්ගේ මානව හිමිකම් සුරක්ෂිත කිරීම, ශ්‍රී ලංකාවේ වත්මන් නීතිමය රාමුව විසින් පනවන ලද අභියෝග ජය ගැනීම කෙරෙහි අවධානය යොමු කිරීම, මානව හිමිකම් කඩ වූ ශ්‍රී ලංකාවේ LGBTQ පුද්ගලයින් හට යුක්තිය ලබා ගැනීමට ඔවුනට අවශ්‍ය සහය ලබාදීමද අරමුණු කරගනී.

BRIDGE to Equality ව්‍යාපෘතිය 2021 වසරේ සිට DAST, National Transgender Network සහ Young Out Here ආයතන විසින් ජාත්‍යන්තර නීතිවේදීන්ගේ කොමිෂන් සභාව සමග ඒකාබද්ධව ක්‍රියාත්මක කරනු ලබයි.

facebook.com/BridgetoEquality
instagram.com/bridgetoequality2021
twitter.com/B2ECampaign
bridgetoequalitycampaign@protonmail.com